

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2021

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණිය

ශ්‍රී ලංකා

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්

ප්‍රකාශයට පත් කරන ලදී

2022

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය විසින් සම්පාදනය කොට කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය මගින් මුද්‍රණය කරන ලදී.

සියලුම හිමිකම් ඇවිරිණි. විවේචනය හා පුනරීක්ෂණය සඳහා කෙටි වාක්‍ය ඛණ්ඩවල උපුටා ගැනීම් හැරුණුවිට, මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව, නැවත ඉදිරිපත් කිරීම, පුනරුත්ථාපනය කළ හැකි වන සේ ගබඩා කර තැබීම, විද්‍යුත්, යාන්ත්‍රික, ඡායාස්ථිත, පටිගත කිරීම හෝ වෙනත් ක්‍රම උපයෝගී කරගනිමින් සම්ප්‍රේෂණය කිරීම සපුරා තහනම් වේ. අසාධාරණයක් නොවන පරිදි වාණිජ නොවන ස්වරූපයේ කටයුතු සඳහා මෙම අවසරය ලබාදීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන ප්‍රකාශන වල, වාණිජ නොවන, කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේදී ගාස්තු ගෙවීම අනවශ්‍යවේ. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණාත්මක සොයාගැනීම් සඳහා අව්‍යාජව යොදා ගැනීමට මෙම හිමිකම් ඇවිරීමේ ප්‍රකාශය බාධාවක් නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය : 285

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 13
පරිච්ඡේදය 03 - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 31
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 37
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය 47
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 48
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 49
ඇමුණුම් 59

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර මනා දැනුමැති කෘෂිකාර්මික විශේෂඥයින් පිරිසක් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයක් සහිත දිවයින පුරා ආවරණය වන ආයතන ජාලයක් සහිත විශාලතම රජයේ දෙපාර්තමේන්තුවකි.

ගොවියාගේ ආදායම හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ සුරක්ෂිත කෘෂිකාර්මික නිෂ්පාදන දැරිය හැකි මිලකට ලබාදීම සඳහා හරිත කෘෂිකර්ම ප්‍රතිපත්තිය සමඟ ආහාර බෝග අංශයේ ඵලදායීතාව සහ නිෂ්පාදනය තිරසාර ලෙස ඉහළ නැංවීම කෙරෙහි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අභිප්‍රායන් යොමුගත වී ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන ප්‍රධාන ක්ෂේත්‍රයන් ලෙස පර්යේෂණ, ව්‍යාප්ති කටයුතු, කෘෂි අධ්‍යාපනය, බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ බීජ, පැළෑටි නිරෝධායනය, පාංශු සංරක්ෂණය හා පළිබෝධනාශක හා සබැඳි නියාමන සේවා කටයුතු දැක්විය හැක. ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රයේ නියාමන කටයුතු සිදුකරනු ලබන ප්‍රධාන පාර්ශවකරු වන්නේද මෙම දෙපාර්තමේන්තුවයි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ ව්‍යුහය වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය යන බෝග පර්යේෂණ ආයතන හතරකින්ද, බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය, ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය යන තාක්ෂණික සේවා මධ්‍යස්ථාන හයකින්ද, ඉංජිනේරු අංශය, මුදල් අංශය, පරිපාලන අංශය, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය යන සහායක සේවා සපයන අංශ හතරකින්ද සමන්විත වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

ඉදිරි දැක්ම

ජාතික සෞභාග්‍ය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

මෙහෙවර

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාල සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශවකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්පත්කර ගැනීම.

අරමුණු


- ආහාර බෝග වගාවේ නිෂ්පාදන විභවයන් වැඩිදියුණු කිරීම.
- තිරසාර සහ පරිසර හිතකාමී ගොවිතැන තහවුරු කිරීම.
- ශ්‍රම සහ ඉඩම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.
- කෘෂිකර්මාන්තයේ නියැලි සියළු පාර්ශව බලගැන්වීම.
- කෘෂිකර්මාන්තය තුල මානව සම්පතෙහි හැකියා වර්ධනය.

- පාර්ශවකරුවන් සඳහා ගුණාත්මක තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍යවල සුලභතාවය සහතික කරලීම.
- බීජ සහ රෝපණ ද්‍රව්‍ය මෙන්ම කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිතීන් සුරක්ෂිත කරලීම.
- ඉඩම් සහ ජල සම්පත ප්‍රශස්ත මට්ටමෙන් භාවිත කිරීම.
- සැලසුම්, ප්‍රතිපත්ති තීරණ සහ ප්‍රතිපත්ති විධාන සඳහා පහසුකම් සැලසීම.
- දේශීය ශාක හානිකර විදේශීය විශේෂවලින් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- කෘෂි නිෂ්පාදන තුලින් විදේශ විනිමය වැඩිකිරීම සඳහා නීරෝගී ශාක සහ ශාක නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැපයීම.
- පළිබෝධනාශකවල අයහපත් බලපෑම්වලින් මහජනයා සහ පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- පැළෑටි ජාන සම්පත් තිරසාර ලෙස භාවිතයට ගැනීම පිළිබඳ සහතිකවීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- පර්යේෂණ මඟින් උචිත නව ප්‍රභේද හා කෘෂි තාක්ෂණයන් ජනනය කිරීම.
- නව දියුණු කෘෂි තාක්ෂණය ගොවි ප්‍රජාව අතර ව්‍යාප්ත කිරීම.
- උසස් ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම.
- පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය කිරීම.
- බීජ පනත, පැළෑටි සංරක්ෂණ පනත, ගස් හෙළීමේ පනත, පළිබෝධ නාශක පාලන පනත සහ පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම.
- සහතිකකරණය මගින් බීජවල ගුණාත්මය තහවුරු කිරීම.
- කෘෂිකාර්මික අධ්‍යාපනය තුලින් කෘෂිකර්මය පිළිබඳ ජාතික වෘත්තීය පුහුණු (NVQ) 5 හා 6 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා පවත්වා ගෙන යාම, ගොවීන් සහ නිලධාරීන්ගේ හැකියා වර්ධනයට අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.

1.4. සංවිධාන සටහන



වී. පර්. හා සං.	- වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
ක්ෂේ. බෝ. පර්. හා සං.	- ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
උ. බෝ. පර්. හා සං.	- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
පල. පර්. හා සං.	- පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය
ස්ව. ස. කළ.	- ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය
ස. ආර්. හා සැල.	- සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය
බී. ස. හා පැ. සං.	- බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය
බී. හා රෝ. ද්‍ර. සං.	- බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය
ව්‍යාප්ති හා පුහුණු	- ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය
කෘ. තො. හා ස.	- ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය
ප්‍ර, මෙ.හා ඇ.	- ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ:

1.5.1 කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
1.5.2 අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) කාර්යාලය - පේරාදෙණිය
1.5.3 අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) කාර්යාලය - පේරාදෙණිය
1.5.4 අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) කාර්යාලය - පේරාදෙණිය
1.5.5 ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලය - පේරාදෙණිය

1.5.6 වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය - බතලගොඩ
    1.5.6.1 ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල
    1.5.6.2 වී පර්යේෂණ ස්ථානය - අම්බලන්තොට
    1.5.6.3 වී පර්යේෂණ ස්ථානය - බෙන්තොට
    1.5.6.4 වී පර්යේෂණ ස්ථානය - ලබුදුව
    1.5.6.5 වී පර්යේෂණ ස්ථානය - සමන්තුරේ
    1.5.6.6 වී පර්යේෂණ ස්ථානය - පරන්තන්
    1.5.6.7 වී පර්යේෂණ ස්ථානය - මුරුන්කන්

1.5.7 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහඉලුප්පල්ලම
    1.5.7.1. තෙල් හා මාෂ බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අඟුණකොළපැලැස්ස
    1.5.7.2 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල
    1.5.7.3 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - කිලිනොච්චි
    1.5.7.4 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය - කරදියන්ආරු
    1.5.7.5 උපයෝගිතා පර්යේෂණ ස්ථානය - වවුනියා
    1.5.7.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තිරුනෙල්වේලි
    1.5.7.7 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල
    1.5.7.8 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - වීරවිල
    1.5.7.9 ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය - මහඉලුප්පල්ලම

1.5.8 උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ගන්නෝරුව
    1.5.8.1 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල
    1.5.8.2 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - සීතාඑළිය
    1.5.8.3 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ
    1.5.8.4 ආහාර පර්යේෂණ ඒකකය - ගන්නෝරුව
    1.5.8.5 උද්‍යාන බෝග පර්යේෂණ ස්ථානය - කල්පිටිය
    1.5.8.6 උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපල - ගන්නොරුව
    1.5.8.7 උපයෝගිතා පර්යේෂණ ඒකකය - වාගොල්ල

1.5.8.8 උපයෝගිතා පර්යේෂණ ඒකකය - තිබ්බටුමුල්ල

1.5.8.9 උපයෝගිතා පර්යේෂණ ඒකකය - වාරියපොළ

1.5.8.10 උපයෝගිතා පර්යේෂණ ඒකකය - තඹබෝව

1.5.9 පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය - හොරණ

1.5.9.1 තිරසාර කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර

1.5.9.2 පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය - ගන්නෝරුව

1.5.9.3 පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම

1.5.9.4 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - මඳුරුකැටිය

1.5.9.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - මුතුකණ්ඩිය

1.5.9.6 පළතුරු බෝග පර්යේෂණ ගොවිපල - එරමිණිගොල්ල

1.5.9.7 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - රහංගල

1.5.9.8 දොඩම් පර්යේෂණ ඒකකය - බිබිල

1.5.9.9 ජාතික පළතුරු ප්‍රභේද සංරක්ෂණ මධ්‍යස්ථානය - කුණ්ඩසාලේ

1.5.10 ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය

1.5.10.1 පාංශු සංරක්ෂණ දැනුම් කළමනාකරණ මධ්‍යස්ථානය - කුණ්ඩසාලේ

1.5.10.2 ස්වාභාවික සම්පත් කළමනාකරණ හා පාංශු සංරක්ෂණ ආදර්ශ කේන්ද්‍රය - කුණ්ඩසාලේ

1.5.11 සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය - පේරාදෙණිය

1.5.12 ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය - පේරාදෙණිය

1.5.12.1 සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - අහුණකොළපැලැස්ස

1.5.12.2 සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - ගන්නෝරුව

1.5.12.3 සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - හංසයාපාලම

1.5.12.4 ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය - අනුරාධපුර

1.5.12.5 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - අඩ්ඩාලච්චන

1.5.12.6 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - වාවින්න

1.5.12.7 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - පොළොන්නරුව

1.5.12.8 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - වීරවිල

1.5.12.9 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - අහුණකොළපැලැස්ස

1.5.12.10 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - කරපිංච

1.5.12.11 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - කුණ්ඩසාලේ

1.5.12.12 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පැල්වෙහෙර

1.5.11.13 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - වවුනියා

1.5.11.14 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - අනුරාධපුර

1.5.12.15 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - ලබුදුව
1.5.12.16 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පාලමුණේ
1.5.12.17 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පරන්තන්
1.5.12.18 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - වාරියපොළ
1.5.12.19 උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනය - බිබිල
1.5.12.20 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - අන්තර් පළාත, අම්පාර
1.5.12.21 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - අන්තර් පළාත, අනුරාධපුර
1.5.12.22 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - අන්තර් පළාත, හම්බන්තොට
1.5.12.23 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - අන්තර් පළාත, හසලක
1.5.12.24 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - අන්තර් පළාත, මොණරාගල
1.5.12.25 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - අන්තර් පළාත, පොළොන්නරුව
1.5.12.26 මී මැසි සංවර්ධන ඒකකය - බිඳුණුවැව, බණ්ඩාරවෙල
1.5.12.27 තරුණ ගොවි සමාජ මූලස්ථානය - පේරාදෙණිය
1.5.12.28 කෘෂි ව්‍යාපාර සංවර්ධන අංශය - ගන්නොරුව
1.5.12.29 ආර්ථික මධ්‍යස්ථානය - දඹුල්ල

1.5.13 ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය - ගන්නෝරුව
1.5.13.1 කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය - ගන්නෝරුව
1.5.13.2 කෘෂි ගුවන්විදුලි සේවාව - කොළඹ
1.5.13.3 කෘෂි ගුවන්විදුලි සේවාව - මහනුවර
1.5.13.4 කෘෂි ගුවන්විදුලි සේවාව - අනුරාධපුර
1.5.13.5 කෘෂි ගුවන්විදුලි සේවාව - මාතර
1.5.13.6 කෘෂි තාක්ෂණ උද්‍යානය - ගන්නෝරුව
1.5.13.7 කෘෂි තාක්ෂණ උද්‍යානය - බටඅත

1.5.14 බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය
1.5.14.1 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - අලුත්තරම
1.5.14.2 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - අම්පාර
1.5.14.3 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - බටඅත
1.5.14.4 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - නාරාහේන්පිට
1.5.14.5 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කන්තලේ
1.5.14.6 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කිලිනොච්චි
1.5.14.7 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කුණ්ඩසාලේ
1.5.14.8 නියෝජ්ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - මහඉලුප්පල්ලම
1.5.14.9 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - නිකවැරටිය
1.5.14.10 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - සීතාඑළිය
1.5.14.11 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - පැල්වෙහෙර

1.5.14.12 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - පොළොන්නරුව
1.5.14.13 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - තෙලිජ්ජවිල
1.5.14.14 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - වවුනියා
1.5.14.15 සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කරදියන්ආරු
1.5.14.16 සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - මුරුන්කන්
1.5.14.17 සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - යාපනය
1.5.14.18 රජයේ බීජ ගොවිපල - අලුත්තරම
1.5.14.19 රජයේ බීජ ගොවිපල - අම්බලන්තොට
1.5.14.20 රජයේ බීජ ගොවිපල - අඹේපුස්ස
1.5.14.21 රජයේ බීජ ගොවිපල - මහඉලුප්පල්ලම
1.5.14.22 රජයේ බීජ ගොවිපල - කන්තලේ
1.5.14.23 රජයේ බීජ ගොවිපල - මිද්දෙණිය
1.5.14.24 රජයේ බීජ ගොවිපල - පොළොන්නරුව
1.5.14.25 රජයේ බීජ ගොවිපල - මල්වත්ත, අම්පාර
1.5.14.26 රජයේ බීජ ගොවිපල - මුරුන්කන්
1.5.14.27 රජයේ බීජ ගොවිපල - කරදියන්ආරු
1.5.14.28 රජයේ බීජ ගොවිපල - පරන්තන්
1.5.14.29 රජයේ බීජ ගොවිපල - කුණ්ඩසාලේ
1.5.14.30 රජයේ බීජ ගොවිපල - මීපිලිමාන
1.5.14.31 රජයේ බීජ ගොවිපල - රහංගල
1.5.14.32 රජයේ බීජ ගොවිපල - උඩරදැල්ල
1.5.14.33 රජයේ බීජ ගොවිපල - සීතාඑළිය
1.5.14.34 රජයේ බීජ ගොවිපල - බටඅත
1.5.14.35 රජයේ බීජ ගොවිපල - කඳපොල
1.5.14.36 රජයේ බීජ ගොවිපල - පිදුරුතලාගල
1.5.14.37 රජයේ බීජ ගොවිපල - වල්පිට
1.5.14.38 රජයේ බීජ ගොවිපල - උල්පතගම
1.5.14.39 රජයේ බීජ ගොවිපල - බණ්ඩාරගම
1.5.14.40 රජයේ බීජ ගොවිපල - තෙලිජ්ජවිල
1.5.14.41 රජයේ බීජ ගොවිපල - පැල්වෙහෙර
1.5.14.42 රජයේ බීජ ගොවිපල - ඉඹිණිමිටිය
1.5.14.43 රජයේ බීජ ගොවිපල - වීරපාන
1.5.14.44 රජයේ බීජ ගොවිපල - එළුවන්කුලම
1.5.14.45 පළතුරු බෝග පර්යේෂණ ගොවිපල - අඹතැන්න
1.5.14.46 කෘෂි බීජ අලෙවි සැල - කොළඹ 07
1.5.14.47 එළවළු බීජ මධ්‍යස්ථානය - ගන්නෝරුව
1.5.14.48 බීජ බෝංචි ඒකකය - රිකිල්ලගස්කඩ

1.5.14.49 කෘෂි බීජ අලෙවි සැල - මාතර

1.5.14.50 කෘෂි බීජ අලෙවි සැල - මහඉලුප්පල්ලම

1.5.14.51 කෘෂි බීජ අලෙවි සැල - බතලගොඩ

1.5.14.52 කෘෂි බීජ අලෙවි සැල - වාගොල්ල

1.5.14.53 කෘෂි බීජ අලෙවි සැල - මදුරුකැටිය

1.5.14.54 කෘෂි බීජ අලෙවි සැල - බණ්ඩාරවෙල

1.5.14.55 කෘෂි බීජ අලෙවි සැල - පරන්තන්

1.5.14.56 කෘෂි බීජ අලෙවි සැල - පොලොන්නරුව

1.5.14.57 කෘෂි බීජ අලෙවි සැල - අළුත්තරම

1.5.14.58 කෘෂි බීජ අලෙවි සැල - අම්බලන්තොට

1.5.14.59 කෘෂි බීජ අලෙවි සැල - කුණ්ඩසාලේ

1.5.14.60 කෘෂි බීජ අලෙවි සැල - නිකවැරටිය

1.5.14.61 කෘෂි බීජ අලෙවි සැල - බටඅත

1.5.14.62 කෘෂි බීජ අලෙවි සැල - ගන්නොරුව

1.5.14.63 බීජ අර්තාපල් ගබඩාව - සීතාඑළිය

1.5.14.64 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - අඹේපුස්ස

1.5.14.65 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - වල්පිට

1.5.14.66 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - නාරාහේන්පිට, කොළඹ 05

1.5.14.67 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - පස්යාල

1.5.14.68 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - බත්තරමුල්ල

1.5.14.69 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - අම්පාර

1.5.14.70 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - කරදියන්ආරු

1.5.14.71 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - ඉහිනිමිටිය

1.5.14.72 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - යටියන

1.5.14.73බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - පැල්වෙහෙර

1.5.14.74 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - තෙලිජ්ජවිල

1.5.14.75 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - කල්තොට

1.5.14.76 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවිසැල - වීරපාන

1.5.14.77 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - පුත්තලම

1.5.14.78 අතිරේක ආහාර බෝග බීජ ගබඩාව - රහංගල,බොරලන්ද

1.5.14.79 උද්‍යාන විද්‍යා පර්යේෂණ ගොවිපල - පස්යාල

1.5.15 බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නෝරුව

1.5.15.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නෝරුව

1.5.15.1.1 බීජ සහතික කිරීමේ සේවය - අළුත්තරම

1.5.15.1.2. බීජ සහතික කිරීමේ සේවය - බටඅත

1.5.15.1.3 බීජ සහතික කිරීමේ සේවය - මහඉලුප්පල්ලම

1.5.15.1.4 බීජ සහතික කිරීමේ සේවය - නිකවැරටිය
1.5.15.1.5 බීජ සහතික කිරීමේ සේවය - පැල්වෙහෙර
1.5.15.1.6 බීජ සහතික කිරීමේ සේවය - පොළොන්නරුව
1.5.15.1.7 බීජ සහතික කිරීමේ සේවය - බිබිල
1.5.15.1.8 බීජ සහතික කිරීමේ සේවය - හිඟුරක්ගොඩ
1.5.15.1.9 බීජ සහතික කිරීමේ සේවය - කන්තලේ
1.5.15.1.10 බීජ සහතික කිරීමේ සේවය - කුණ්ඩසාලේ
1.5.15.1.11 බීජ සහතික කිරීමේ සේවය - සීතාඑලිය
1.5.15.1.12 බීජ සහතික කිරීමේ සේවය - අම්පාර
1.5.15.1.13 බීජ සහතික කිරීමේ සේවය - බතලගොඩ
1.5.15.1.14 බීජ සහතික කිරීමේ සේවය - මඩකලපුව
1.5.15.1.15 බීජ සහතික කිරීමේ සේවය - කොළඹ
1.5.15.1.16 බීජ සහතික කිරීමේ සේවය - ලබුදුව
1.5.15.1.17 බීජ සහතික කිරීමේ සේවය - මුරුන්කන්
1.5.15.1.18 බීජ සහතික කිරීමේ සේවය - පැල්මඩුල්ල
1.5.15.1.19 බීජ සහතික කිරීමේ සේවය - රිකිල්ලගස්කඩ
1.5.15.1.20 බීජ සහතික කිරීමේ සේවය - වවුනියාව
1.5.15.1.21 බීජ සහතික කිරීමේ සේවය - මාතර
1.5.15.1.22 බීජ සහතික කිරීමේ සේවය - මතුගම
1.5.15.1.23 බීජ සහතික කිරීමේ සේවය - යාපනය
1.5.15.1.24 බීජ සහතික කිරීමේ සේවය - පරන්තන්
1.5.15.1.25 බීජ පරීක්ෂණාගාරය - පේරාදෙණිය
1.5.15.1.26 බීජ පරීක්ෂණාගාරය - මහඉලුප්පල්ලම
1.5.15.1.27 බීජ පරීක්ෂණාගාරය - අළුත්තරම
1.5.15.1.28 බීජ පරීක්ෂණාගාරය - බටඅත
1.5.15.1.29 බීජ පරීක්ෂණාගාරය - පරන්තන්
1.5.15.1.30 පශ්චාත් පාලන ක්ෂේත්‍රය I - ගන්නෝරුව
1.5.15.1.31 පශ්චාත් පාලන ක්ෂේත්‍ර අංක II - ගන්නෝරුව
1.5.15.1.32 පශ්චාත් පාලන ක්ෂේත්‍රය - සීතාඑලිය
1.5.15.1.33 පශ්චාත් පාලන ක්ෂේත්‍රය - මහඉලුප්පල්ලම
1.5.15.1.34 පශ්චාත් පාලන ක්ෂේත්‍ර - කරදියන්ආරු
1.5.15.1.35 පශ්චාත් පාලන ක්ෂේත්‍රය හා බීජ කෞතුකාගාරය - බටඅත
1.5.15.1.36 බීජ සෞඛ්‍ය ඒකකය - ගන්නෝරුව

1.5.15.2 පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නෝරුව
1.5.15.2.1 පැලෑටි සංරක්ෂණ සේවය, මහඉලුප්පල්ලම
1.5.15.2.2 පැලෑටි සංරක්ෂණ සේවය, බෝඹුවල, කළුතර

1.5.15.3 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය

1.5.15.4 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය - ගන්නෝරුව

1.5.15.5 ජාතික පැළෑටි නිරෝධායන සේවය - කටුනායක

1.5.15.5.1 පැළෑටි නිරෝධායන ඒකකය - ගුවන්තොටුපොල, මත්තල

1.5.15.5.2 පැළෑටි නිරෝධායන ඒකකය - හම්බන්තොට වරාය

1.5.15.5.3 පැළෑටි නිරෝධායන ඒකකය - ගුවන්තොටුපොල, යාපනය

1.5.16.5.4 පැළෑටි නිරෝධායන ඒකකය - මධ්‍යම තැපැල් හුවමාරුව

1.5.16 පරිපාලන අංශය - පේරාදෙණිය

1.5.17 ආයතන අංශය - පේරාදෙණිය

1.5.18 ඉංජිනේරු අංශය - පේරාදෙණිය

1.5.18.1 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - කුණ්ඩසාලේ

1.5.18.2 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - පොළොන්නරුව

1.5.18.3 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - අඟුණකොලපැලැස්ස

1.5.18.4 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - සීතාඑළිය

1.5.19 මුදල් අංශය - පේරාදෙණිය

1.5.20 අභ්‍යන්තර විගණන අංශය - පේරාදෙණිය

1.5.21 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පේරාදෙණිය

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්: නැත

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු :

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන)	කාලසීමාව
01. ආසියාවේ වී අස්වනු පරතරය පියවීම	IRRI	3.33	2013 -2022
02. AFACI සාමාජික රටවල් වලට ලවණතාවට ඔරොත්තු දෙන උසස් වී ප්‍රභේද වරණය හා ප්‍රචාරණය	AFACI	3.33	2019 -2021
03. විවිධ පරිසර වලදී ආසන්න වියන් පරිසරයේ පැහැදිලි භාවය හා වී වල තාප ප්‍රේරිත ශූකිකා වන්ධ්‍යතාව අධ්‍යයනය	NIAES	0.16	2019 -2022
04. ආසියානු කලාපයේ සංක්‍රමණික රෝග සහ කෘමි පලිබෝධ සඳහා වසංගත විද්‍යා තොරතුරු අන්තර් හුවමාරු පද්ධතියක් ගොඩ නැගීම	AFACI	5.34	2019 -2022
05. ශ්‍රී ලංකාවේ සෝයා බෝංචි ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය ජනනය කිරීම	KOPIA	6.21	2018 -2021
06. උසස් තත්ත්වයේ එෑණු බීජ නිෂ්පාදන ආදර්ශ ගම්මානයේ පසුවිපරම් කළමනාකරණය	KOPIA	2.7.4	2019 -2021
07. ශ්‍රී ලංකාව තුළ ගොවිපල පාදක දෙමුහුම් මිරිස් බීජ නිෂ්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීම	KOPIA	5.995	2019 -2021
08. ආසියාවේ එළවළු ප්‍රභේද සංවර්ධනය	AFACI	3.51	2020 -2022
09. ජමනාරන් වල ගුණාත්මකභාවය හා ඵලදායිතාව වැඩි දියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ගොවීන්ගේ ආදායම වැඩි කිරීම	KOPIA	5.96	2018 -2023
10. බිම්මල් ගොවියාගේ ආදායම වැඩි කිරීම සඳහා නිෂ්පාදන හා උපයෝගීතා තාක්ෂණ බිහි කිරීම	KOPIA	7.73	2017 -2022

ව්‍යාපෘතියේ නම	**දායක නියෝජිතායතනය**	**ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන)**	**කාලසීමාව**
11. තිරසාර කාබනික ගොවිතැන සඳහා වූ ආසියානු ජාලය	AFACI	0.61	2016 -2021
12. කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීමේ තාක්ෂණ බිහි කිරීම	AFACI	5.1	2019 -2021
13. පසු අස්වනු අත්පොත් පිළියෙල කිරීම සහ ඒවායේ භාවිතය	AFACI	0.78	2016 -2021
14. ශ්‍රී ලංකාවේ ආහාර බෝග වල කළු කියත් පණුවන් (*Helicoverpa* spp,) පාලනය කිරීමෙහිලා නියුක්ලියෝ පොලිහෙඩ්‍රොන් වෛරස් වල Nucleo polyhedron viruses (NPV) කාර්යක්ෂමතාව ලාක්ෂණිකරණය	USDA	1.12	2020 -2023
15. ශ්‍රී ලංකාවේ සුවිශේෂී පරිසර දූෂණ කලාප තුනක වායුගෝලීය නයිට්‍රජන් දූෂණ ප්‍රභව ඇගයීම, පාරිසරික තිරසර බව හා මානව සෞඛ්‍යයට ඇති කෙරෙන බලපෑම සහ පිළියම් ක්‍රියාමාර්ග සෙවීම	IAEA	0.35	2018 -2022
16. ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත සංරක්ෂණ ප්‍රදේශ වල කඳුකර කෘෂිකාර්මික ජලාධාරවල කෘෂි අපවිත්‍රකාරක මූලාශ්‍ර ප්‍රවාහන ක්‍රම හඳුනා ගැනීම	IAEA	0.94	2018 -2023
17. ආසියාවේ පාංශු සිතියම හා ජාතික පාංශු තොරතුරු පද්ධති සංවර්ධනය	AFACI	4.5	2019 -2023
18. දේශීය වශයෙන් උචිත GAP වැඩසටහන් සහ කෘෂිකාර්මික නිෂ්පාදන සුරක්ෂිතතා තොරතුරු පද්ධතිය ගොඩ නැගීම	AFACI	0.4	2016 -2021
19. කෘෂිකාර්මික තාක්ෂණ තොරතුරු ජාලය	AFACI	1.68	2010 -2021
20. අගයදාම සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හරහා සාක් කලාපයේ කුඩා ගොවීන්ගේ ජීවනෝපාය උසස් කිරීම	SDF	5.0	2020 -2021

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ

<u>වී</u>

- ජාතික සම්බන්ධීකරණ වී වර්ග අත්හදා බැලීමේ දී මාස 4½ කාණ්ඩයට අයත් උසස් අභිජනන පෙළපත් දෙකක් (20-470, 20-2378) තව දුරටත් ඉදිරි අත්හදා බැලීම් සඳහා නිර්දේශ විය. මාස 3½ වයස් කාණ්ඩය යටතේ උසස් පෙළපත් 34ක් මූලික අස්වනු පරීක්ෂණයටද 11ක් ප්‍රධාන අස්වනු පරීක්ෂණයද සිදුකල අතර පෙළපත් 2ක් බලාපොරොත්තු තැබිය හැකි පෙළපත් ලෙස තෝරා ගැණින. මාස තුන වයස් කාණ්ඩයට අයත් උසස් පෙළපත් 27ක් මූලික අස්වනු පරීක්ෂණයටද 14ක් ප්‍රධාන අස්වනු පරීක්ෂණයටද භාජනය කර පෙළපත් 4ක් බලාපොරොත්තු තැබිය හැකි උසස් පෙළපත් ලෙස තෝරා ගැණින. මාස 2½ වයස් කාණ්ඩය යටතේ උසස් පෙළපත් 19ක් හා 10ක් මූලික හා ප්‍රධාන අස්වනු පරීක්ෂා සඳහා භාජනය කර පිළිවෙලින් උසස් පෙළපත් දෙක බැගින් තෝරා ගන්නා ලදී.
- පොකුරු සම්බා වර්ගයේ කොළ පාළුව හා බැක්ටීරියානු කොළ අංගමාරය යන රෝග වලට ඔරොත්තු දෙන පෙළපත් නිපදවීමේ අභිජනන පෙළපත් වලින් පෙළපත් දෙකක් එම රෝග දෙක සඳහාම ප්‍රතිරෝධී බවක් පෙන්වා ඇති අතර තව දුරටත් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම සඳහා තෝරා ගන්නා ලදී.
- පැල ගොයමට හානි කරන පැල මැක්කාගේ හානිය සහ පසු අවස්ථාවල දී ඇතිවන දුඹුරු පැල කීඩෑ හානිය, පුරුක් පණු හානිය, කොළ හකුලන දළඹුවාගේ හානිය හා ගොයම් මකුණාගේ හානිය සැලකිය යුතු ලෙස අඩුකර ගැනීම සඳහා වී ශාකයේ ප්‍රතිශක්ති උත්තේජන සිලිකන් නිෂ්පාදනයක් පැල ස්ථාපිත කර සති දෙකේ දී භාවිතා කිරීම යෝග්‍ය බව නිරීක්ෂණය කරන ලදී. පර්යේෂණ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක වේ.
- ලංකාවට ආනයනය කරන බාස්මති සහල් නියම ප්‍රමිතියෙන් යුතු බාස්මතිද යන්න පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවෙන් එවන ලද සහල් සාම්පල 267ක් පරීක්ෂාවට ලක්කල අතර එයින් 38.4% පමණක් නියම බාස්මති සතු ගුණාංග සහිත සහල් සාම්පල බව හඳුනා ගන්නා ලදී.
- පාරම්පරික වී ප්‍රභේද කාබනික තත්ව යටතේ වගා කිරීමේදී පැරෂුට් තාක්ෂණයෙන් ස්ථාපිත කිරීම සඳහා සුදුසුම තවාන් තැටි ගණන සොයා බැලීම සඳහා කල පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස අක්කරයකට තවාන් තැටි 400ක් සුදුසු බව සොයා ගන්නා ලදී. මෙහිදී පාරම්පරික වී වර්ග 4ක් භාවිතා කරන ලදී. සුවදැල්, පොක්කාලි, කළු හීනටි හා පච්චපෙරුමාල් එම වී වර්ග හතර වේ.
- බතලගොඩ ඇතුළු වී පර්යේෂණ ස්ථාන සියල්ලම විවිධ වර්ගයේ බිත්තර වී නිපදවීම සිදු කරයි. අභිජනන බීජ කිලෝ ග්‍රෑම් 7,000ක් ද, අත්තිවාරම් බීජ, පැලවීම පරීක්ෂා කළ හා වාණිජ බීජ ලෙස කිලෝ ග්‍රෑම් 34,170ක් ද, පාරම්පරික ප්‍රභේද වල කිලෝ ග්‍රෑම් 2,470ක් පමණ වූ බිත්තර වී නිෂ්පාදනයක්ද සිදු කර ඇත.
- වී පර්යේෂණ හා පුහුණු ආයතනය මගින් වී වගාව සම්බන්ධයෙන් ගොවි කණ්ඩායම්, නිලධාරින්, ඩිප්ලෝමා සිසුන් විශ්ව විද්‍යාල සිසුන් සඳහා පුහුණු වැඩසටහන් හා අනෙකුත් ඉල්ලීම මත විවිධ පුහුණු වැඩසටහන් සිදුකරනු ලබයි. 2021 වසරේ විවිධ කණ්ඩායම් ලෙස පැමිණි පුද්ගලයින් 2301ක් සඳහා වී වගාව සම්බන්ධයෙන් තාක්ෂණික පුහුණු කටයුතු සිදුකර ඇත.

- ආසියාතික ආහාර හා කෘෂිකර්ම සහයෝගිතාවය යටතේ 2019, 2020 හා 2021 වසර වල ක්‍රියාත්මක කළ ලවණතාවයට ඔරොත්තු දෙන අභිජනන පෙළපත් තේරීමේ වැඩසටහනින් ආසියාතික රටවල් 7ක් අතරින් කැපී පෙනෙන රට ලෙස හිමි වන සම්මානය 2021 වසරේදී වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අභිජනන අංශයේ ආර්.එම්.එන්.එච්. සේනානායක මහත්මිය විසින් දිනා ගන්නා ලදී.

<u>අතිරේක ආහාර බෝග</u>

- කව්පි සහ මුං බෝග වගාවේදී පිදුරු වසුන් යෙදූ සහ වසුන් නොයෙදූ අවස්ථාවලට සාපේක්ෂව පොලිතින් වසුන් භාවිතා කිරීමෙන් මනා වර්ධනයක් සහ ඉහළ අස්වනු කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදී.

- මුං, කව්පි, රටකජු හෝ උඳු යන රනිල බෝග අතරින් ඕනෑම බෝගයක් ශ්‍රී ලංකාවේ වියළි කලාපයෙහි විශේෂයෙන්ම පළමු කන්නය තුළදී කෙසෙල් සමඟ අතරමැදි බෝගයක් ලෙස සාර්ථකව වගා කළ හැකි බව පර්යේෂණ මගින් අනාවරණය විය.

- "අග්‍රා" නැමැති කෝලිකුට්ටු කෙසෙල් ප්‍රභේදයේ පුමාංගී පුෂ්ප යොදා ගනිමින් නිපදවන ලද නලස්ථ පුනර්ජනනීය පැළවල සුවිශේෂ ලක්ෂණ (ඵලයේ දැඩි කැටිතිමය ස්වභාවය නොමැති වීම හා රසය) වෙනස් නොවිණි.

- අඩ වශයෙන් හානියට පත් වූ රටකජුවල පැළ වීම, ප්‍රාණවත් බව හා අස්වැන්න ඉහළ නැංවීම සඳහා හයිඩ්‍රෝ - ප්‍රයිමිම (Hydro - priming) තාක්ෂණික ක්‍රමවේදය ඵලදායි බව හඳුනා ගන්නා ලදී.

- පර්යේෂණ ප්‍රතිඵල තහවුරු කරමින් යල සහ මහ යන දෙකන්නයේදීම ගොවි ක්ෂේත්‍රවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත නයිට්‍රජන් (N), පොස්පරස් (P) සහ පොටෑසියම් (K) අනුපාත හා සසඳන කළ රයිසෝබියම් බීජ ආමුකූලනය සමඟ මූලික ඛණිජ N පොහොර (යුරියා) අනුපාතයෙන් 1/3ක් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත P සහ K පොහොර අනුපාත සැපයූ විට සෝයා බෝංචිවල 13%ක සිට 25% දක්වා අස්වනු වැඩිවීමක් වාර්තා විය.

- විශේෂයෙන්ම මහ කන්නය තුලදී දුර්වල ජලවහන තත්ත්වය යටතේ බීජ පැළවීමේදී සිදුවන හානි අවම කර ගැනීමට බහු අවයවික ආලේපිත සෝයා බෝංචි බීජ ඵලදායි බව හඳුනා ගැණින.

- තීරු දෙකක් අතර පරතරය සෙ.මී. 90 වනසේ සෙ.මී. 45 x සෙ.මී. 30 ප්‍රමාණයේ පේළි 4 තීරුවල බඩ ඉරිහු වගා කිරීම, අස්වනු හානියක් නොමැතිව සේනා දළඹු පාලනය සඳහා රසායනික ද්‍රව්‍ය යෙදීම සහ බීජ වැපිරීම සඳහා පහසු වන වගා පරතරයක් බව හඳුනාගන්නා ලදී.

- කොම්පෝස්ට් (හෙක්ටයාරයට ටොන් 10) හෝ ජෛව අඟුරු (හෙක්ටයාරයට ටොන් 10) සමඟ කොම්පෝස්ට් (හෙක්ටයාරයට ටොන් 10) ආකාරයෙන් කාබනික ද්‍රව්‍ය යෙදීම ලොකු ඵැණුවල අස්වැන්න ඉහළ නැංවීමේදී ඵලදායි බව හඳුනා ගැණින. ලොකු ඵැණු අස්වැන්න තවදුරටත් වැඩි කිරීමෙහිලා පිදුරු (හෙක්ටයාරයට ටොන් 5) හෝ පරාවර්තිත පොලිතීන් වසුන් ලෙස යොදා ගැනීම බෙහෙවින් ඵලදායි විය.

- විළඳ (Popcorn) වගාව සඳහා ඵලදායී ශෂ්‍ය විද්‍යාත්මක කළමනාකරණ පැකේජයක් වශයෙන් එක් වලකට එක් පැළයක් වන සේ සෙ.මී. 45 x සෙ.මී. 30 පරතරයේ පැළ සිටුවා නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් මුල ද්‍රව්‍ය පිළිවෙලින් හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 150-46-30 යෙදීම හඳුනා ගන්නා ලදී.

- ට්‍රයිකොඩර්මා (*Trichoderma*) නිෂ්පාදනවල ඝන අවස්ථාව යොදාගනිමින් ඵෑණු කළු පැහැති දිලීරය පාලනය කිරීම සඳහා ක්ෂේත්‍ර යෙදවුම් ප්‍රොටොකෝලයක් (Protocol) ගොඩනගන ලදී.

- මිරිස් බෝගයට වැළඳෙන ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනයට ඇසොක්සිට්‍රොබින් 60 සමග ක්ලෝරොතැලොනිල් ලීටරයට ග්‍රෑම් 500 SL ඵලදායී බව සොයා ගැණින.

- රටකජු මලකඩ (Groundnut Rust) රෝගයට පිළියම් වශයෙන් සල්ෆර් 80 WDG උචිත බව යළි තහවුරු කරන ලදී.

- බඩඉරිඟු වගාවේ සේනා දළඹුවා පාලනය කිරීම සඳහා 3G ද්‍රාවණය ජලය සමඟ 10% (v/v) අනුපාතයෙන් යෙදීම ඵලදායී විය. කීටයන් බිහිවන මුල් අවධියෙහිදීම සවස් කාලයේ දී එම ද්‍රාවණය යෙදීම මනා ප්‍රතිඵල ලබා දුන්නේය.

- මිරිස්වල උසස් තත්ත්වයේ කරල් සමඟින් ඉහළ අස්වනු ලබා ගැනීම සඳහා කරල් හටගන්නා අවධියේ දී පත්‍රවලට ඉසිනයක් වශයෙන් මුරුංගා පත්‍ර නිස්සාරකය (MLE 100%) යෙදීම ඵලදායී ක්‍රමයක් බව හඳුනා ගැණින.

- ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ රටකජුවල (*Arachis hypogea*) කඳ කුණුවීමේ රෝගය හා සම්බන්ධ දිලීරමය ව්‍යාධිජනකයන් වශයෙන් ස්ක්ලෙරෝටියම් (*Sclerotium)* විශේෂ දහ අටක් හඳුනා ගැණින.

- පැයට කිලෝග්‍රෑම් 30ක යෙදවුම් ධාරිතාවයකින් යුත් මිරිස් බීජ නිස්සාරකයක මූලාකෘතියක් (Prototype) සාර්ථක අන්දමින් නවීකරණය කරන ලදී.

- වාණිජමය වගාව සඳහා පෞද්ගලික අංශය මඟින් ආනයනය කරන ලද හෙක්ටයාරයකට ටොන් 16-20ක සාමාන්‍ය අමුමිරිස් අස්වැන්නක් ලබා දෙන විදේශීය මිරිස් දෙමුහුම් තුනක් නිර්දේශ කෙරිණ.

- චොකලට් බෝල කර්මාන්තය සඳහා සරිලන හෙක්ටයාරයකට ටොන් 2.5කට වැඩි සාමාන්‍ය අස්වැන්නක් ලබා දෙන කුඩා බීජ සහිත රටකජු ප්‍රභේදය සාමාන්‍ය වගාව සඳහා ANKGN4 ප්‍රභේදය නමින් නිදහස් කරන ලදී.

- හෙක්ටයාරයකට ටොන් 1ක පමණ දළ අස්වැන්නක් ලබා දෙන කඳ හා මුල් කුණුවීමේ රෝගයට මධ්‍යස්ථ වශයෙන් ඔරොත්තු දෙන කළු පැහැති බීජ සහිත තල ප්‍රභේදය ANKSE3 නමින් සාමාන්‍ය වගාව සඳහා නිදහස් කරන ලදී.

- හෙක්ටයාරයකට ටොන් 20 - 22ක දළ අස්වැන්නක් ලබා දෙන පොකුරු ඵෑණු ප්‍රභේදය ANKCLO1 නමින් සාමාන්‍ය වගාව සඳහා නිදහස් කෙරිණ.

- සරල අනුපිළිවෙල පුනරාවර්තන (Simple sequence Repeat/ SSR) සළකුණු භාවිතයෙන් ගොඩනංවන ලද ප්‍රොටොකෝලය MICH HY 1 හා MICH HY 2 මිරිස් දෙමුහුම්වල බීජ සහතිකකරණ ක්‍රියාපටිපාටියේදී ප්‍රයෝජනවත් වනු ඇත. තවද මෙම සොයා ගැනීම් MICH HY 1 හා MICH HY 2 මිරිස් දෙමුහුම් බීජ තොගවල දෙමුහුම් නොවන ආකාරයේ මිශ්‍ර වීම් හඳුනා ගැනීමට අභිජනකයන්ට මෙන්ම වගාකරුවන්ටද ප්‍රයෝජනවක් වනු ඇත.

- කළු තල වලින් තෙල් නිස්සාරණය කිරීමේ ක්‍රියාවලියේ දී විශිෂ්ට තත්ත්වයේ ඉහළ තෙල් ප්‍රමාණයක් ලබා ගැනීමේ උචිතම ක්‍රමවේදය 180^0C උෂ්ණත්වයේ මිනිත්තු 15ක් කර කිරීම (roasting) බව සොයා ගැණින.

- සෝයා කිරි නිෂ්පාදනය සඳහා PM 13 හා PM 25 ආර (පෙළ) වඩාත් යෝග්‍ය බව හඳුනා ගන්නා ලදී.

<u>උද්‍යාන බෝග</u>

එළවළු

- කාබනික ගොවිතැනෙහි ශාඛ රෝග පාළනය සඳහා ජෛව තාක්ෂණික ක්‍රමවේදයක් ලෙස ට්‍රයිකොඩර්මා දිලීරය මඟින් ජෛව දිලීරනාශකයක් නිපදවන ලදී. මෙය මාළුමිරිස්, තක්කාලි, බටු, මෑ සහ බෝංචි වගාවේ පාංශු දිලීර රෝග, පත්‍ර පුල්ලි රෝග හා පිටිපුස් රෝගය පාලනය සඳහා ද, සලාද වල අළු පුල්ලි රෝගය හා කිරි අල වගාවේ කෝම කුණු වීම වැනි රෝග සාර්ථකව පාළනය සඳහා ද යොදා ගැනේ.

- එළවළු වගාවේ පළිබෝධක දළඹුවන් හා සේනා දළඹුවා පාලනයට බිත්තර පරපෝෂී ටෙලෙනෝමස් රෙමුස් (*Telenomus remus*) කෘමීන් කෘතීමව ගුණනය කොට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රදේශවලට නිදහස් කරන ලදී. මෙමඟින් අධික කෘමිනාශක භාවිතයෙන් තොරව එළවළු වගාවන් මෙම පළිබෝධක හානියෙන් වළක්වා ගැනීමට හැකිවී ඇත.

- පරිසර හිතකාමී කෘමි පළිබෝධ පාලනයක් ලෙස කහ පැහැති විශේෂිත විදුලි බල්බ රාත්‍රී කාලයේ එළවලු වගා ක්ෂේත්‍ර වල යෙදීම මගින් 100% සාර්ථක ලෙස වගා ක්ෂේත්‍රයට රාත්‍රී කාලයේ පැමිණෙන සලඹ විශේෂ පාලනය කළ හැකි බව හඳුනාගන්නා ලදී. මෙමඟින් කෘමිනාශක භාවිතයෙන් තොරව බෝග අස්වැන්නේ ගුණාත්මකභාවයද ආරක්ෂා වන පරිදි එළවළු වගාවන් මෙම පළිබෝධක හානියෙන් වළක්වා ගැනීමට හැකිවී ඇත.

- කරවිල හා තක්කාලි සඳහා ශාක ආවරණ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙහිදී තනි ශාකය බැගින් ආවරණ කරන අතර මෙමඟින් එළවළු වගාවේ වෛරස් රෝග වාහකයින් හා පළිබෝධකයින් ඉතා සාර්ථක ලෙස පාළනය කිරීම සිදු කෙරේ.

- කෙටි කාලයකින් (සති 06 කින්) කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණය හඳුන්වාදී ඇත.

පළතුරු

- අලුතින්ම නිදහස් කරන ලද හොරණ දෙහි 01 හි බද්ධ පැල 2000ක් නිපදවන ලදී.

- බලාපොරොත්තු තැබිය හැකි අන්නාසි දෙමුහුම් හයක්, ඉහළ අස්වැන්නක් සහ පලතුරෙහි අවශ්‍ය ගුණාංග සහිත වූ අඹ එකතූන් දෙකක් සහ කොස්වල බලාපොරොත්තු තැබිය හැකි එකතූන් කිහිපයක් ඇගයීම සඳහා තෝරා ගන්නා ලදී.

- පුෂ්ප හටගැනීම ආරම්භක අවධියේ දී පැළයකට කිලෝ ග්‍රෑම් 15ක ප්‍රමාණයෙන් ඩොලමයිට් පසට එක් කිරීමෙන් මැංගුස්ටීන්වල කහ යුෂ අසාමාන්‍යතාව අඩු කළ හැකි බව සොයා ගැණින.

- කොලෙටොට්‍රිකම් තියොබ්‍රෝමයිකෝලා *(Collectotrichum theobromicola)*, ෆයිලොසිටික්ටා ඉලොන්ගාටේ (*Phyllositicta elongate)* සහ ලැසියෝඩිප්ලෝඩියා සිව්ඩෝතියෝබ්‍රොමේ (*Lasiodiplodia pseudotheobromae)* නමැති ක්ෂුද්‍ර ජීවීන් අනෝදා ඵල කුණු වීම කෙරෙහි බලපා හැකි ක්ෂුද්‍ර ජීවීන් බව තහවුරු කර ගන්නා ලදී. නලස්ථ තත්ව යටතේදී කාබෙන්ඩිසම් 50 WP (687.5 ppm), ටෙබියුනකොනසෝල් 250 EW (375 ppm) සහ තියෝෆනේට් මෙතිල් 70 WP (687.5 ppm) යෙදීමෙන් එකී රෝගය යටපත් වන බවද සොයා ගන්නා ලදී. කුරුඳු තෙල්, කරාබු තෙල්, පැහිරි තෙල් සහ මදුරුතලා තෙල් (basil oil) නලස්ථ තත්ව යටතේදී පිළිවෙලින් 6000 ppm, 3000 ppm, 20 000 ppm සහ 9000 pm එම දිලීර විශේෂයෙහි වර්ධනය සැලකිය යුතු මට්ටමෙන් පහත හෙලන බව පෙන්නුම් කළේය.

- වාණිජමය වගාව සඳහා විකල්ප රෝපණ ද්‍රව්‍යයක් වශයෙන් පත්‍ර පොහොර සමඟ අන්නාසි කිරුළ භාවිතය සාර්ථක බව හඳුනා ගන්නා ලද අතර ඵලයේ ප්‍රමාණය හා ගුණාත්මය කෙරෙහි කිරුළේ ප්‍රමාණය බල නොපාන බවද හඳුනාගන්නා ලදී. රෝපණය කිරීමෙන් සති දෙකකට පසු දෙමසක කාලයක් දක්වා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත පත්‍ර පොහොර ඉසීම සිදු කළ යුතුය.

- අන්නාසි පේළි දෙකක් අතර කව්පි වගා කර දින 45කින් පළමු අස්වැන්න නෙළීමෙන් පසු කව්පි පැළ පස හා මුසු කිරීම, තත්ත්වයෙන් උසස් අන්නාසි ඵල ලබා ගැනීමේ සාර්ථක ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණ ක්‍රමවේදයක් බව හඳුනා ගැණින.

- කටු අනෝදා (*Annona muricata*) හි පාතෙනොඵලිත ඵල හටගැනීම උත්ප්‍රේරණය සඳහා 1000 ppm ගිබරලික් අම්ලය (GA 3) හා 6000 ppm නැප්තලීන් ඇසිටික් අම්ලය (NAA) භාවිතා කළ හැකි බව පර්යේෂණ මඟින් හෙළි විය.

- පේර මැලවීම පාලනය සඳහා යොදා ගන්නා ට්‍රයිකොඩර්මා හාසියේනම් *(Trichoderma harzianum*) සහ ට්‍රයිකොඩර්මා හැමටම් *(Trichoderma hamatum)* තොග රෝපණය සඳහා බීජාණු සෑදීමට උචිතම මාධ්‍ය ලෙස දහයියා සහ සහල් නිවුඩු 4:1 අනුපාතයෙන් මිශ්‍රණය සමග කුරක්කන් බීජ තෝරා ගන්නා ලදී.

- ප්‍රධාන අමුද්‍රව්‍ය වශයෙන් ලාවුළු පිටි 35%ක් සහ සහල් පිටි 65%ක් මිශ්‍ර කොට බිස්කට් වර්ගයක් සකස් කරන ලද අතර එය පොලිප්‍රොපිලීන්වල (200G) මාස දෙකක් ගබඩා කර තබා ගත හැකිය.

- පේරවල මූල ගැටිති නෙමටෝඩා පාලනය සඳහා වටපණුනාශකයක් ලෙස බඳුනකට ෆ්ලූඕපිරැම් 400/lsc මිලි ලීටර් 2ක් ජලය මිලි ලීටර් 250ක අනුපාතයට දියකර යෙදීම සාර්ථක භාවිතයක් බව හඳුනා ගන්නා ලදී.

- මැංගුස් ඵලය තුළට කුහුඹුවන් ඇතුළුවීම වැළැක්වීමේ සාර්ථක ක්‍රමවේදයක් ලෙස ඩයසිනොන් 500g/l EC ලීටරයට මිලි ලීටර් 10 අනුපාතයෙන් හෝ ඉමිඩැක්ලෝප්‍රිඩ් 200g/l SL ලීටරයට මිලි ලීටර් 1ක අනුපාතයෙන් සකස් කළ ද්‍රාවණයක ගිල් වූ කපු රෙදි කඩක් භාවිතයෙන් කඳ ආවරණය (මීටර් 1ක්) කිරීම හඳුනා ගන්නා ලදී.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත රසායනික පොහොර සමඟ ඇමෝනියම් සල්ෆේට් පත්‍ර පොහොරක් ලෙස යෙදීම මඟින් රඹුටන් බර වැඩි වූ අතර අස්වැන්නද 5%කින් ඉහළ ගියේය.

- වාණිජමය වශයෙන් කෙසෙල්වල පටක රෝපිත පැළ නිෂ්පාදනය සඳහා "මිල්ලැව සුවඳැල්" නමැති කෙසෙල් ප්‍රභේදයට අදාළව පටක රෝපණ ප්‍රොටොකෝලයක් ගොඩනගන ලදී.

- කෙසෙල්වල පටක රෝපිත රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිණිස පලතුරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයෙහි කෙසෙල් මව් ශාක උද්‍යානය පිහිටුවන ලද අතර කෙසෙල් පැල 5,500ක් පමණ ගොවීන් අතර බෙදා හරින ලදී.

<u>ස්වභාවික සම්පත් කළමනාකරණය</u>

- පසුගිය වසරට සාපේක්ෂව (සාම්පල 163) මෙම වසරේ (සාම්පල 655) පාංශු සාම්පල විශ්ලේෂණ ධාරිතාව සිව් ගුණයක් දක්වා රසායනාගාර පහසුකම් වැඩි දියුණු කර ඇත.

- කෘෂි - කාලගුණ උපදේශනයෙහි තත්ත්වය උසස් කිරීමෙහිලා දෙපාර්තමේන්තුව තුළ හා ඉන් පිටත විශේෂඥ අදහස් ලබා ගැනීමට වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලදී.

- මහවැලි - වලව කලාපයෙහි අක්කර 10 බැගින් වූ ගොවිපල 5ක් සඳහා ක්ෂුද්‍ර ජල තාක්ෂණ පද්ධති සැලසුම් කිරීම සඳහා තාක්ෂණික සහාය සලසා දුනි.

- මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ගොවින් 60ක් සඳහා ආරක්ෂිත ගෘහ සහ ජල සම්පාදන පද්ධති සැකසීම සඳහා තාක්ෂණික සහය සපයන ලදී.

- "පාංශු හා ජල සංරක්ෂණ තාක්ෂණික සංග්‍රහය" නමැති ග්‍රන්ථය සම්පාදනය කොට පළ කරන ලදී.

- "අනාගත පරපුරට ද භාවිතයට ඉඩ සලසමින් ජල සම්පත ප්‍රශස්ථ ලෙස පරිභෝජනය කරමු" නමින් තිරසාර ජල කළමනාකරණය සම්බන්ධ අත් පොතක් ප්‍රකාශයට පත්කරන ලදී.

<u>සමාජ ආර්ථික විද්‍යාව හා සැලසුම්කරණය</u>

- 2021 වර්ෂය තුළ 2020/21 මහ කන්නය සඳහා වගා පිරිවැය සඳහා ක්ෂේත්‍ර දත්ත රැස් කිරීම අඩ වශයෙන් නිම කරන ලද අතර කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ක්ෂේත්‍ර වැඩසටහන ප්‍රමාද විය. 2021 වසර සඳහා තෝරාගනු ලැබූ ආහාර බෝග වගා පිරිවැයෙහි පළාත්බද ඇස්තමේන්තු සකස් කරන අතරම 2021 යල කන්නය සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීම සැලසුම් කරන ලදී.

- පශ්චාත් 2020/21 මහ, 2021 යල හා පූර්ව 2021/22 මහ කන්න ආවරණය කරමින් 2021 වර්ෂය තුළ බෝග පුරෝකථනය වාර්තා 10ක් (කන්නයට පහ බැගින්) සකස් කරන ලදී.

- ක්ෂේත්‍ර මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා කාර්යක්ෂම දත්ත ගලායමක් සහතික කරමින් "බෝග පුරෝකථන තොරතුරු පද්ධතිය - Croplook.net" මෘදුකාංගය වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.

- දත්ත ඇතුළත් කරන්නා වූ කාර්ය මණ්ඩලය පරිපාලනය සහ නියාමනය සඳහා පාලන පද්ධති (පැනල) පහසුකමක් ගොඩ නංවන ලද අතර ප්‍රභේදමය වශයෙන් එළවළු බෝග නිෂ්පාදනය පිළිබඳ වාර්තා ගොඩනැංවීමට පහසුකමක් යොදන ලදී. තවද අතිරේක ආහාර බෝග සඳහා දිස්ත්‍රික්කමය වශයෙන් ප්‍රභේදීය ව්‍යාප්ති වාර්තාවක් නව අතිරේකයක් ලෙස ඇතුළත් කරන ලදී.

- 2020 වසර සඳහා දත්ත අඩංගු AgStat XVIII වෙළුම සම්පාදනය කරන ලදී.

- බෝග ව්‍යවසාය අයවැය - 2020 නමැති වී, අතිරේක ආහාර බෝග හා එළවළු සඳහා දත්ත අඩංගු ප්‍රකාශන මුද්‍රණය කොට මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රකාශයට පත් කරන ලදී.

<u>**ව්‍යාප්ති හා පුහුණුව**</u>

"සෞභාග්‍යා" බෝග සංවර්ධන වැඩසටහන යටතේ,

- දිවයින පුරා හෙක්ටයාර 328,332ක් වෙනුවෙන් අතිරේක ආහාර බෝගවල බීජ සඳහා සහනාධාර සපයන ලදී.

- වී වගා ව්‍යාපෘතිය යටතේ පරිසර හිතකාමී ගොවිතැන අනුගමනය කිරීමට ගොවීන් පොළඹවන ලදී. විශේෂයෙන්ම කාබනික පොහොර භාවිතය, පසට නයිට්‍රජන් ලබාදීම සඳහා 'ඇසොල්ලා' භාවිතය සහ ගැඹුරු සී සෑම ප්‍රවර්ධනය කරන ලදී. තවද, යාන්ත්‍රිකකරණය ප්‍රවර්ධනය සඳහා හෙක්ටයාර 341ක බිම්කොටස් ඒකාබද්ධ කිරීම සිදු කරන ලදී. හෙක්ටයාර 341ක් ස්ථාපිත කරමින් පැරෂුට් ක්‍රමය ප්‍රවර්ධනය කරන ලද අතර ඒ සඳහා 50% ගොවි දායකත්වය යටතේ පැරෂුට් තැටි 79,000ක් බෙදා දෙන ලදී.

- උඳු, මුං, කව්පි යන බෝග වල ඵලදායිතාවය ඉහළ නැංවීම හා නිෂ්පාදන ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩි අස්වනු තාක්ෂණ පැකේජය භාවිතා කරන ගොවීන් හට බීජ සහ බිම් සැකසීම සඳහා සහනාධාර ලබාදීම, වගාවන් වන සතුන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා සූර්ය බලයෙන් ක්‍රියා කරන විදුලි වැට නොමිලේ ගොවි සංවිධාන වෙත ලබා දීම, වගා ළිං ඉදිකිරීම හා නවීකරණය සඳහා සහනාධාර ලබාදීම, යන්ත්‍රීකරණය සඳහා යන්ත්‍ර ලබාදීම හා කමත් අතුරු 3,126ක් ලබා දීමද සිදු කරන ලදී.

- තුන්වන කන්නය සඳහා මුං හෙක්ටාර 25,500ක් සාර්ථක ලෙස වගා කරන ලද අතර ඒ හේතුවෙන් වසරේ සිවු වන කාර්තුවේදී මුං ඇට මිල පහල යාම දක්නට ලැබිණි.

- ශ්‍රී ලංකාවේ වියළි මිරිස් නිෂ්පාදනය ඉහල නැංවීමේ අරමුණින් මිරිස් වියලන යන්ත්‍ර 50ක් නොමිලේ ගොවි සංවිධාන වෙත ලබා දෙන ලදී. තවද 50% ගොවි දායකත්වය යටතේ විසිරුම් ජල සම්පාදන පද්ධති ලබා දුන් අතර මිරිස් වියලීම සඳහා කමත් අතුරු 2,000ක් නොමිලේ ගොවීන් වෙත ලබා දෙන ලදී.

- මිරිස් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දෙමුහුම් බීජ භාවිතය දිරි ගැන්වීමට බීජ සහනාධාර ලබා දෙන ලද අතර MICH - HY- 1 දෙමුහුම් ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය ගොවි ක්ෂේත්‍රයේදී වූ පූර්ණ යාන්ත්‍රික පොලි ගෘහ තුල සිදු කරන ලදී.

- ලොකු ළූණු බීජ නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩි කිරීම සඳහා ලොකු ළූණු බීජ නිෂ්පාදන ක්ෂේත්‍රතාපනය සඳහා මව් බල්බ කි.ග්‍රෑ. 30,000ක් රඳවා තබා ගැනීම සඳහා සහනාධාර ලබා දෙන ලදි. (ළූණු බල්බ සඳහා වියදමෙන් 50% ගොවි දායකත්වය යටතේ) තවද, බීජ වසන්තිකරණය සඳහා නුවරඑළිය වෙත ප්‍රවාහන වියදමද ගොවීන් වෙත ලබා දෙන ලදි.

- දිවයින පුරා ව්‍යාප්ති කඳවුරු, මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ 2020/21 මහ කන්නය තුළ ෆෙරමෝන් උගුල් මඟින් මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම මගින් බඩ ඉරිඟු වගාවේ සේනා දළඹු හානිය සාර්ථක ලෙස පාලනය කරන ලදී.

- දෙමුහුන් බඩ ඉරිඟු බීජ නිෂ්පාදනය 2021 වසරේදී උතුරු ප්‍රදේශයේ විශේෂයෙන් යුද හමුදාවේ සහයෝගය ඇතිව අඛණ්ඩව සිදු කරන ලදී.

- විශේෂයෙන්ම කව්පි හා උඳු බෝග සඳහා ගොවි ක්ෂේත්‍රවලින් වන සතුන්ගෙන් ආරක්ෂා කිරීමට සූර්ය බලශක්තියෙන් ක්‍රියා කරන විදුලි උපකරණයක් හඳුන්වා දෙන ලදී.

- වාණිජ මට්ටමේ පලතුරු පොකුරු ගම්මාන ඇතිකිරීම සඳහා තෝරාගන්නා ලද පලතුරු වර්ග වල පැල ගොවීන් වෙත නොමිලේ බෙදා හරින ලද අතර පලතුරු වගාවේදී අවශ්‍ය වන උපකරණ 50% ගොවි දායකත්වය යටතේ ලබා දෙන ලදී.

- මාතලේ අලුවිහාරේ සහ අනුරාධපුර ශ්‍රී මහා බෝධිය යන ආගමික ස්ථානවල හෙළ බොජුන් හල් දෙකක ඉදිකිරීම් කටයුතු අවසන් අදියරට පැමිණ තිබේ.

ඊට අමතරව,

- කොවිඩ් 19 වසංගතය තිබියදීත් 2021 යල සහ 2020/2021 මහ කන්නය තුළදී කෘෂි නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් දෙකක් සාර්ථක ලෙස පවත්වන ලදී.

- සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තයේ සිට කාබනික කෘෂිකර්මාන්තය දක්වා පරිවර්තනය සඳහා පළාත්, අන්තර් පළාත් ප්‍රදේශ, මහවැලි කලාප හෝ වෙනත් පාර්ශ්වකරුවන් පළාත් අතර මනා සහයෝගීතාවක් පවත්වා ගැනීමට 2021 යල කන්නය ආරම්භ වීමට පෙර වැඩසටහන් හතරක් පවත්වන ලදී. කාබනික කෘෂිකර්මාන්තය සඳහා පළාත්, අන්තර් පළාත් සහ මහවැලි නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් දහයක් පවත්වන ලදී.

- පැළ තවාන් කළමනාකරණය, බිම්මල් නිෂ්පාදනය, මී පැණි නිෂ්පාදනය සහ ආහාර පිරිසැකසුම සම්බන්ධව කුඩා පරිමාණ කෘෂි - ව්‍යවසායකයන්ට අදාළව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.

- කෘෂිකර්ම නිෂ්පාදනය තාක්ෂණය (NVQ 5) ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ විභාගය අනුරාධපුරය, බිබිල, වාරියපොළ, ලබුදුව, පරන්තන් සහ පාලමුනෙයි යන කෘෂිකර්ම විද්‍යාලවල පවත්වන ලදී.

- 2021 වර්ෂයේදී NVQ 6 විද්‍යාලවල ශිෂ්‍යයන් 787ක් කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවද, NVQ 5 විද්‍යාලවල ශිෂ්‍යයන් 258ක් කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාවද හදාරන ලදී.

- 2021 වර්ෂයේදී ශිෂ්‍යයන් 206ක් කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 6) ද, ශිෂ්‍යයන් 114ක් කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5) ද සාර්ථකව නිම කරන ලදී.

- යහපත් කෘෂිකර්මික පිළිවෙත් (GAP) පිළිබඳ මහජන දැනුම්වත් කිරීම්, ගොවි හා නිලධාරි පුහුණු කිරීම් ඇතුළුව පුහුණු වැඩසටහන් 80ක් පවත්වන අතරම SL - GAP ගොවිපලවල් 545 ක් වර්ෂය තුළ දී සහතික කරන ලදී.

- සාක් (SAARC) සංවර්ධන අරමුදලේ මූල්‍ය සහාය ලබාගනිමින් ‘‘අගය දාම කෙරෙහි අවධානය යොමු කරමින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර ඔස්සේ SAARC කලාපවල කුඩා ගොවීන්ගේ ජීවනෝපාය ඉහළ නැංවීම’’ පිළිබඳ වැඩසටහන තවදුරටත් සිදු කරගෙන යන ලදී. දේශීය ආහාර බෝග (ප්‍රදේශයට විශේෂිත වූ) සැකසීම සඳහා අනුරාධපුර හා මොණරාගල ප්‍රදේශවල පිරිසැකසුම් මධ්‍යස්ථානය දෙකක් ස්ථාපනය කරන ලදී.

<u>කෘෂිකාර්මික තොරතුරු සහ සන්නිවේදනය</u>

- ගොවි ප්‍රජාව හා අදාළ වෙනත් පාර්ශ්වකරුවන් වෙත නව කෘෂිකාර්මික තාක්ෂණය බෙදා හැරීම සඳහා රූපවාහිනී වැඩසටහන් 161ක් ද විශේෂ වීඩියෝ වැඩසටහන් 277ක් ද කෙටි වීඩියෝ පණිවුඩ 25ක් ද වසර තුළදී විකාශය කරන ලද අතර යූ ටියුබ් කෙටි විඩියෝ පට 256ක් අන්තර්ජාලයට ඇතුලත් කරන ලදී.

- කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කරුණු සහ ගැටළු පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් 1,676ක් සහ කෙටි පණිවුඩ 480ක් වසර තුළ දී විකාශය කෙරිණි.

- කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් නව පොත් 70ක් (පිටපත් 122,191) ද පත්‍රිකා 45ක් (පිටපත් 1,826,128) ද පෝස්ටර් පිටපත් 51,430ක් ද නිමකර බෙදා හරින ලදී.

- කෘෂිකර්මය පිළිබඳ නව පිටු 346ක් සමාජ මාධ්‍ය ජාලවලට එකතු කරන ලදී.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා පරිශීලනයට පහසු නව වෙබ් අඩවියක් නිර්මාණය කරන ලද අතර එහි පිටු 118ක් යාවත්කාලීන කරන ලදී.

- රූපියල් මිලියන 4.25ක ආදායමක් වාර්තා කරමින් ගන්නෝරුව හා බටඅත කෘෂි උද්‍යානය නැරඹූ පිරිස 34,316ක් විය.

- කෘෂිකාර්මික ප්‍රකාශන අලෙවියෙන් ඉපැයූ ආදායම රූපියල් මිලියන 2.21කි.

- පාංශු පරීක්ෂණ වාර්තා කළමනාකරණ පද්ධතියෙහි I වන අදියර, පළිබෝධනාශක ලියාපදිංචි කිරීම, බීජ වෙළඳපොල පද්ධතිය සහ වත්කම් කළමනාකරණ දත්ත පද්ධතිය සම්පූර්ණ කරන ලදී. මූල්‍ය දත්ත පද්ධතිය, පැළෑටි ජාන සම්පත් MIS - I වන අදියර, පාංශු පරීක්ෂණ වාර්තා කළමනාකරණ ක්‍රමවේදයෙහි දත්ත පද්ධතිය යනාදිය සංවර්ධනය කිරීමේ කටයුතු තවදුරටත් සිදු කෙරෙමින් පවතී.

- කෘෂිකර්මාන්තය ආශ්‍රිතව පැන නැගුණු ගැටළුවලින් 73,718කට 1920 කෘෂි උපදේශන සේවාව ඔස්සේ පිළිතුරු සපයන ලදී.

- කාබනික නිෂ්පාදනය පිළිබඳව විශේෂ මාධ්‍ය ප්‍රචාරයක් රූපවාහිනී වැඩසටහන් 32ක් ද රූපවාහිනී කෙටි පණිවිඩ 5ක් ද වෙළඳ දැන්වීමක්ද LED පැනල් හරහා දිනපතා කෙටි පණිවුඩ මුදා හරිමින් මෙන්ම සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන්ම පත්‍රිකා 1,212,000ද පෝස්ටර 28,350ක් ද නිකුත් කරමින් සිදු කරන ලදී. සතිපතා ගුවන්විදුලි වැඩසටහන් 35, කෘෂි ටීවී යූ ටියුබ් කෙටි විඩියෝ පට 34ක්, කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳව ලියැවුණ පොත්වල පිටපත් 30,800ක්, පුවත් ලිපි 46ක් ද මේ යටතේ මුදා හරින ලද අතර දැනුම්වත්භාවය ඉහළ නංවමින් මාර්ගගත පුහුණු වැඩසටහන් 8ක් පැවැත්වීමද සමාජ මාධ්‍ය දැන්වීම් සහ විඩියෝ පට 148ක් මුදා හැරීම ද සිදු කෙරිණ.

<u>බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධනය</u>

- ලියාපදිංචි බීජ වී බුසල් 150,013ක් පමණ නිෂ්පාදනය කරන ලදී.

- සහතික කළ බීජ වී බුසල් 56,552ක් පමණ මිලදී ගන්නා ලදී.

- සමස්තයක් ලෙස බීජ වී බුසල් 185,233ක් අළෙවි කරන ලදී.

- අතිරේක ආහාර බෝගවල විවිධ බීජ කාණ්ඩයන්හි බීජ ටොන් 1,348ක් පමණ නිෂ්පාදනය කරන ලදී.

- බඩඉරිඟු බීජ කි.ග්‍රෑ 92,159ක්, රටකජු බීජ කි.ග්‍රෑ 248,655ක්, සෝයා බෝංචි කි.ග්‍රෑ 115,314ක්, මුං බීජ කි.ග්‍රෑ 401,663ක්, උඳු බීජ කි.ග්‍රෑ 234,615ක් හා කව්පි බීජ කි.ග්‍රෑ 85,501ක් පමණ නිෂ්පාදනය කර අළෙවි කරන ලදී.

- මූලික එළවළු බීජ කි.ග්‍රෑ 1,560ක් සහ සම්මත එළවළු බීජ 19,300ක් පමණ නිෂ්පාදනය කරන ලදී.

- අර්තාපල් මූලික බීජ සහ සහතික කළ බීජ ටොන් 1,079ක් හා ග්‍රැනෝලා වර්ගයේ ක්ෂුද්‍ර ආකන්ද 2,477,800ක් පමණ නිෂ්පාදනය කර අළෙවි කරන ලදී.

- පළතුරු පැල 1,170,397ක් පමණ (බද්ධ පැල 592,687ක් ඇතුළුව) නිෂ්පාදනය කර අළෙවි කරන ලදී.

- කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහන යටතේ ගෙවතු වගා ඇසුරුම් ලක්ෂ 25 ක් සකස් කර කෘෂිකර්ම අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය හා වෙනත් රජයේ ආයතන වෙත බෙදා දෙන ලදී.

<u>බීජ සහතික කිරීම සහ පැළෑටි ආරක්ෂණය</u>

- කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරන ලද කමිටුවක් මඟින් බීජ පනත සංශෝධනය කර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

- ISO17065 ජාත්‍යන්තර ප්‍රමිතිය අනුව යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහතිකකරණය සඳහා සියලුම සහතිකකරණ ක්‍රමවේදය සකස් කරන ලදී.

- 2021 වර්ෂය තුළ දී ගුණාත්මය තහවුරු කළ බීජ වී නිෂ්පාදනය සඳහා හෙක්ටයාර 7,776ක් රාජ්‍ය, කොන්ත්‍රාත් හා පෞද්ගලික අංශ වලින් ලියාපදිංචි කළ අතර මින් 79% ක් සඳහා දායකත්වය ලබාදුන්නේ පෞද්ගලික අංශය යි. ගුණාත්මය සහතික කළ මෙම ක්ෂේත්‍ර මගින් බීජ වී මෙට්‍රික් ටොන් 16,685 ක් නියැදි ලබාගත් අතර ඉන් 13,976 මෙට්‍රික් ටොන් බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුකූල ලෙස පිළිගැණිනි.

- ගුණාත්මය තහවුරු කළ අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදනය සඳහා හෙක්ටයාර 1,955ක් ලියාපදිංචි කළ අතර, ඒ සඳහා කොන්ත්‍රාක් ගොවීන්ගේ දායකත්වය 92% ක් විය. බඩඉරිඟු, මුංඇට, රටකජු, තල, කව්පි, කුරක්කන්, උඳු, කොල්ලු හා සෝයා බෝංචි මෙම බීජ වී නිෂ්පාදන වැඩසටහනට අයත් වූ අතර, මෙට්‍රික් ටොන් 1,136ක් නිපදවනු ලැබූ අතර මින් 94% ක ප්‍රමාණයක් බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුකූලව පිළිගැනුණි.

- ගුණාත්මය තහවුරු කළ එළවළු බීජ නිෂ්පාදනය සඳහා හෙක්ටායර 321ක වපසරියක් ලියාපදිංචි කළ අතර මේ සඳහා රාජ්‍ය හා කොන්ත්‍රාත් අංශ වල දායකත්වය 82% කි. මේ මගින් එළවළු බීජ මෙට්‍රික් ටොන් 41ක් නිෂ්පාදනය කළ අතර බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුකූල වූ මෙට්‍රික් ටොන් 38ක් පිළිගැනුණි.

- 2021 වර්ෂය සඳහා ගුණාත්මය සහතික කළ ග්‍රැනෝලා වර්ගයේ බීජ අර්තාපල් නිපදවීම සඳහා හෙක්ටයාර 109.2ක් ලියාපදිංචි කළ අතර මින් මෙට්‍රික් ටොන් 1,159ක් බීජ සහතික කිරීමේ සේවය ප්‍රමිතීන්ට අනුකූල ලෙස සහතික කර ඇත. ආරක්ෂිත ගෘහයන් යටතේ වගා කරන ලද බීජ අර්තාපල් මෙට්‍රික් ටොන් 46ක් හා මූලික පන්තියේ කුඩා ස්කන්ධ ආකන්ද 3,278,051ක් බීජ සහතික කිරීමේ සේවය ප්‍රමිතීන්ට අනුකූල ලෙස පිළිගැනුණි.

- පේරාදෙණිය, අළුත්තරම, බටඅත, මහඉලුප්පල්ලම හා පරන්තන් යන බීජ පරීක්ෂණාගාරයන් මගින් නියැදි 14,351 ක ගුණාත්මය තහවුරු කිරීමට පරීක්ෂා කරන ලදී. එමෙන්ම බීජ සෞඛ්‍ය පරීක්ෂණාගාරය මගින් පැතිරෙණ රෝග කාරක තහවුරු කිරීම සඳහා නියැදි 804 ක් පරීක්ෂා කර ඇත.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි බද්ධ පලතුරු පැළ නිපදවන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ තවාන් 339 ක් ලියාපදිංචි කර ඇති අතර ඒවායේ කටයුතු අධීක්ෂණය කර ඇත. බද්ධ පලතුරු පැළ 1,356,174 ක් සඳහා ගුණාත්මය තහවුරු කර සහතික ලේබල් යොදා ඇත. එමෙන්ම බද්ධ පලතුරු පැළ නිපදවීම සඳහා මව්ශාක 674 ක් ද සහතික කර ඇත.

- බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුකූලව සහතික කරන ලද බීජ, ආනයනික බීජ හා බීජ අර්තාපල් හා වෙළඳපොල තුළින් අහඹු ලෙස ලබාගත් බීජ නියැදි 1,303ක් සඳහා පශ්චාත් පාලන ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකර ගුණාත්මය තහවුරු කර ඇත.

- අළුතින් ප්‍රභේද නිදහස් කිරීමේදී නව ප්‍රභේදයක් ලෙස තහවුරු කිරීම සඳහා සිදු කරන විශේෂත්වය, ඒකාත්මිකතාව හා ස්ථායිතා (DUS) පරීක්ෂාවන්, අපේක්ෂිත වී ප්‍රභේද සඳහා 3ක් ද , එළවළු සඳහා 27ක් ද, අතිරේක ආහාර බෝග සඳහා 8 ක් ද, පලතුරු සඳහා 65ක් ද ලෙස සිදුකරන ලදී.

- 2003 අංක 22 දරණ බීජ හා රෝපණ ද්‍රව්‍ය පනත යටතේ බීජ හසුරුවන්නන් 1,185ක් ලියාපදිංචි කළ අතර 955 ක ලියාපදිංචිය අළුත් කිරීම ද සිදුකරන ලදී.

- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරන ගොවිපල්වල ගුණාත්මය තහවුරු කිරීම සඳහා ගොවිපල් 635ක් විගණනයට භාජනය කළ අතර ඉන් ගොවිපල් 561ක් යහපත් කෘෂිකාර්මික ගොවිපල් ලෙස සහතික කරන ලදී.

- වී වගාවේ ප්‍රධාන පලිබෝධකයින් සඳහා පළිබෝධ ආවේක්ෂණ වැඩසටහන් වී වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක හතක නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලදී.

- බඩඉරිඟු වගාවේ සේනා දළඹු පාලනයට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දී ඇති පරිසර හිතකාමී පාලන ක්‍රමවේදය ගොවින් අතර ප්‍රචලිත කරන ලදී.

- වඩාත් කාර්යක්ෂම සේවාවක් සඳහා කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ ශාක නිරෝධායන ස්ථානය සඳහා මධ්‍යම රජයේ ආධාර යටතේ ගොඩනැගිල්ලක් ඉදිකර පිවිසුම්පළ නිරෝධායන කටයුතු වඩාත් පුළුල් අන්දමින් කරගෙන යාම සඳහා පහසුකම් ඇති කරන ලදී.

- කොළඹ වරාය පිවිසුම්පළ නිරෝධායන කටයුතු වඩාත් පුළුල් අන්දමින් ඉටුකිරීම සඳහා නව ගොඩනැඟිල්ලක් කොරියානු ආධාර යටතේ ඉදිකිරීම ආරම්භ කරන ලදී.

- ශාක හා ශාකමය ද්‍රව්‍ය තැපැල් මඟින් හුවමාරුවීමේදී ඇතිවිය හැකි පළිබෝධ අවදානම අවම කිරීම සඳහා කොළඹ මධ්‍යම තැපැල් හුවමාරුවෙහි ශාක නිරෝධායන ඒකකයක් පිහිටුවන ලදී.

- අඹ හා අන්නාසි භෝග සඳහා ජෝර්දාන ශාක ආරක්ෂණ සංවිධානය මඟින් පනවා තිබූ ශාක නිරෝධායන තහනම ඉවත් කර ගැනීම සඳහා වූ ද්විපාර්ශවික තාක්ෂණික වැඩසටහන සාර්ථක ලෙස නිම කර අඹ සහ අන්නාසි ජෝර්දානයට අපනයනය සඳහා වෙළඳ බාධක ඉවත් කොට අන්තර්ජාතික වෙළඳාම සඳහා පහසුකම් සලසන ලදී.

- යුරෝපා සංගමයේ රටවල් 27 සඳහා නිරෝධායන ව්‍යාධි ජනකයෙකු වන සයිලෙල්ලා ෆාස්ටිඩියෝසා (*Xylella fastidiosa*හි) ධාරක ශාක අපනයනය සඳහා පනවා තිබූ සම්බාධක ඉවත්කර ගැනීමට අදාළ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කරන ලදී.

- අන්තර්ජාතික ශාක ආරක්ෂක සංවිධානයේ මූලිකත්වයෙන් සම්පාදනය කරනු ලබන අන්තර්ජාතික ශාක ස්වස්ථතා සම්මුති අංක 15 යටතේ සල්ෆියුරයිල් ෆ්ලෝරයිඩ් (Sulfuryl fluoride) දැවමය භාණ්ඩ අසුරන ද්‍රව්‍ය ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගැනීම පිළිබඳ තාක්ෂණ කමිටු සාමාජිකත්වය සඳහා ජාතික ශාක නිරෝධායන සේවයේ අතිරේක අධ්‍යක්ෂ තේරී පත්විය.

- ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකර්මය සඳහා අත්‍යවශ්‍ය ශාක පෝෂක ආනයනය සඳහා සම්මත ශාක නිරෝධායන නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී.

- ශාක ආනයනය හා අපනයන කටයුතු කාර්යක්ෂමව හා විනිවිදභාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ASYCUDA පද්ධතිය සමඟ සම්බන්ධ වන ලදී.

- ජෛව ආරක්ෂණ ව්‍යාපෘතිය හරහා ජෛව තාක්ෂණය පිළිබඳ විශ්ලේෂණ සඳහා නව රසායනාගාර ආරම්භ කරන ලදී (GMO and LMO) .

පැළෑටි ජාන සම්පත් කළමනාකරණය

- ක්ෂේත්‍ර ගවේෂණ මෙහෙයුම් මගින් බෝග ජාන ප්ලාස්ම සහ ඒවායෙහි වල් දර්ශයන් 246ක සමස්ත එකතුවක් රැස් කරගන්නා ලද අතර බෝග ප්‍රභේද 82ක් පර්යේෂණායතනවලින් ලබා ගන්නා ලදී. ඊට අමතරව විදේශීය බෝග ජාන ප්ලාස්මා 271ක් ලබා ගන්නා ලදී.

- 2021 වර්ෂයේදී නව එකතූන් 244ක් ජාන බැංකුවෙහි සංරක්ෂණය කරන ලදී. ඊට අමතරව වශයෙන් බහුගුණනය කරන ලද එකතූන් 393ක් සංරක්ෂණය කෙරිණ. පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ජාන බැංකුවෙහි මේ වන විට බෝග ජාන ප්ලාස්මා 16,497ක් සංරක්ෂණය කරනු ලැබ ඇති අතර බතල, අර්තාපල්, ඩයස්කෝරියා (*Dioscorea)*, ඉන්නල සහ කෙසෙල් ඇතුළුව නියැදි 384ක් නලස්ථ සංරක්ෂණයට ලක් කෙරිණ.

- ජාන ප්ලාස්ම උපයෝජනය සඳහා ඉල්ලුම මත ගොවීන්, පර්යේෂණ ස්ථාන පෞද්ගලික සමාගම් සහ විශ්වවිද්‍යාල අතර විවිධ බෝග විශේෂවල එකතූන් 338ක් බෙදා හරින ලදී.

- බෝග ජාන ප්ලාස්ම නියැදි 706ක් ගුණනය කොට සංරක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලදී. සංරක්ෂණය කරන ලද බණ්ඩක්කා එකතූන් 101ක්, මෑ එකතූන් 77ක් හා කැකිරි එකතූන් 33ක් රූපාණු විද්‍යාත්මක ලක්ෂණ භාවිතා කරමින් වර්ගීකරණය කරන ලදී.

- තෝරා ගනු ලැබූ කුලවලට අයත් බෝග වල් දර්ශවල අණුකමය වර්ගීකරණය ද හඳුනා නොගත් ජාන ප්ලාස්මවල DNA කේතකරණයද සම්පූර්ණ කරන ලදී. නිර්දේශිත දෙමුහුම් ප්‍රභේදවල ජානමය පවිත්‍රතාව පරීක්ෂා කිරීම සඳහා ප්‍රොටොකෝලයක් ගොඩ නංවන ලද අතර හීනටි හා මා වී යන සාම්ප්‍රදායික වී ප්‍රභේද අණුකමය හා රූපාණුදර්ශීයවද, හොඩරවාලු වී එකතූන් 21ක් රූපාණුදර්ශීයවද වර්ගීකරණය කරන ලදී. වෙනත් පාරම්පරික ප්‍රභේද 29ක් දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධිතාවක් දක්වන එකතූන් හඳුනා ගැනීමට අණුකමය වශයෙන් වර්ගීකරණය කරන ලදී.

- සියදිවි හානි කර ගැනීම් වැළැක්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ක්‍රියාකාරී සැලැස්මෙහි 2021 අනාගත ප්‍රතිපත්ති සඳහා විශේෂ සම්මානය පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ කාර්යාලය විසින් දිනා ගන්නා ලදී.

අභියෝග

- එළවළු සහ පලතුරු වල පසු අස්වනු හානි අවම කර ගැනීමට ගෙන ඇති තාක්ෂණික ක්‍රියාමාර්ග සැපයුම් දාමය තුල ක්‍රියාත්මක නොවීම.

- වෙළඳපොළේ ගුණාත්මයෙන් අඩු කාබනික පොහොර පැවතීම.

- කාබනික පොහොර නිෂ්පාදනයේදී සිදුවන අවභාවිතය.

- රෝග හෝ පළිබෝධ පාලනය කිරීමේදී රසායනික ක්‍රම වෙනුවට ආකර්ශනීය පරිසර හිතකාමී උපාය මාර්ග වැඩි දියුණු කිරීම.

- බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන්වලදී භාවිතය සඳහා ජානප්ලාස්ම ප්‍රමාණවත් නොවීම.

- ජාත්‍යන්තර විද්‍යාත්මක ප්‍රජාවන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා අඩු වීම.

- 2011 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ සංවර්ධන සහ පර්යේෂණ ධාරාවේ නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි වීම නිසා පවතින නිලධාරි හිඟය.

- රජයේ නව ප්‍රතිපත්තිය, හරිත කෘෂිකර්මය සමඟ ඉදිරියට යාම සඳහා කෘෂි රසායන වලින් තොරව වී වගා කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය සඳහා වූ පර්යේෂණ සිදු කල යුතුව ඇත. විශේෂයෙන්, වල් නාශක හා කෘමි නාශක සඳහා වූ දේශීය ක්‍රම ශිල්ප අත්හදා බැලීමත් නව තාක්ෂණයන් ජනනය කිරීමටත් ඉතා ඉක්මනින් සිදු කළ යුතුව ඇත. ඒ සඳහා පර්යේෂණ නිලධාරීන්ගේ අඩුවක් වර්තමානය වන විට වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පවතී.

- හරිත කෘෂිකර්මය පිළිබඳ රජයේ නව ප්‍රතිපත්තිය පිළිබඳ පර්යේෂණ අවධානය යොමු කිරීම සහ කෙටි කාලයක් තුළ හරිත කෘෂිකර්ම තාක්ෂණය උත්පාදනය කිරීම.

- කොරෝනා වසංගත ව්‍යාප්ති තත්ත්වය බීජ සහතික කිරීමේ කටයුතු සඳහා මහත් බලපෑමක් ඇති කර තිබුණි. මෙම තත්ත්වය යටතේ ගොවි ක්ෂේත්‍ර නිරීක්ෂණය කිරීම හා නියැදි ලබා ගැනීම සඳහා යාමට අවහිරතා ඇති වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ ක්ෂේත්‍ර ප්‍රමාණයක් සහතික බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කළ ද ලේබල් කරන ලද බීජ තොගයේ ප්‍රමාණය අඩුවීමක් සිදු විය. එයට අමතරව පොහොර හිඟතාවය, ගොවියන්ගේ සංචරණ සීමා වීම, වල් පැළෑටි පාලනය සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හිඟ වීම නිසා බොහෝ ක්ෂේත්‍ර බීජ සහතික කිරීමේ ප්‍රමිතීන්ට අනුකූල නොවී ය.

- සංචරණ සීමා පැණ වූ කාලය තුළ බීජ හා රෝපණ ද්‍රව්‍ය සඳහා අධික ඉල්ලුමක් පැවති අතර, එම ක්ෂණික ඉල්ලුම හේතුවෙන් බොහෝ බීජ හා රෝපණ ද්‍රව්‍ය ගුණාත්මය තහවුරු කිරීමකින් තොරවම ගොවියන් විසින් වෙළඳපලට නිකුත් කිරීමට කටයුතු කර තිබිණ.

- මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සියළුම බීජ සහතික කිරීමේ කටයුතු අඩාලවීම කෙරෙහි බලපා ඇත.

- ආනයනය කරන ලද රටෙහි කොන්දේසිවලට අනුකූල වන පරිදි ජාතික ශාක නිරෝධායන සේවාව මගින් නිකුත් කරන ලද ශාක ස්වස්ථතා සහතිකවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් පුළුල් කිරීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම.

- එළවළු සහ පළතුරු අපනයනය සඳහා අවශ්‍ය සහතික කළ ක්ෂේත්‍ර ප්‍රමාණවත් නොවීම.

- ක්ෂේත්‍රයේ නීති විරෝධී පළිබෝධනාශක බහුලව තිබීම හේතුවෙන් අධිකරණ ක්‍රියාදාමයන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවීම.

- පළාත් සභාවල ඇතැම් නිලධාරීන් මධ්‍යම රජයේ ක්‍රියාකාරකම් කෙරෙහි දක්වන අඩු ප්‍රමුඛතාවය නිසා ඇතැම් ප්‍රදේශවල පළිබෝධනාශක පාලන පනත ක්‍රියාත්මක කිරීමේදී ගැටලු මතුවීම.

- මාර්ගගත පුහුණුව සඳහා ඇතැම් ප්‍රදේශවල පහසුකම් නොමැතිකම හේතුවෙන් පුහුණු ක්‍රියාකාරකම් සීමා වීම.

- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු වෙත ක්‍රියාකාරකම් බෙදා හැරීමේදී, එම කාර්යයන් මධ්‍යම කෘෂිකර්ම අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යයන් සහ බලතල සමඟ ඇතැම් විට ප්‍රතිවිරුද්ධ වීම හෝ පරස්පර වීම.

- කෘෂිකාර්මික පර්යේෂණ නවෝත්පාදනයන් ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාවට නැංවීම දුර්වල වීම.

- නොගැලපෙන වෙළඳ ප්‍රතිපත්ති (උදා: තාවකාලික තීරුබදු සහ බදු පැනවීම)

- වෙළඳපල තොරතුරු හිඟකම හෝ ප්‍රමාණවත් නොවීම හා ඒවාට ප්‍රවේශ වීමට නොහැකිවීම හේතුවෙන් බොහෝ භාණ්ඩ සඳහා දුර්වල ගොවිපල-වෙළඳපොල සම්බන්ධතා ඇතිවීම.

- කේවල් කිරීමේ බලයෙන් සවිබල ගැන්වීම සඳහා ස්ථාවර ගොවි ජාල හෝ සමිති නොමැති වීම.

- තිරසාරභාවයට තර්ජනයක් වන පරිදි විවිධ කෘෂිකාර්මික උප අංශ සහ අනෙකුත් ප්‍රධාන අංශ අතර සීමිත ස්වභාවික සම්පත් සඳහා ඉහළ තරඟකාරිත්වයක් පැවතීම.

- ඉඩම් භායනය, කෘෂිකාර්මික ඉඩම් වැරදි ලෙස බෙදා හැරීම, ඉඩම් කැබලි කිරීම සහ දුර්වල ඉඩම් කළමනාකරණය හේතුවෙන් ඉඩම් ඵලදායිතාව අවම වීම.

- නියඟයෙන් හා ගංවතුරින් නිතර සිදුවන පාඩු හා හානි සමඟ දේශගුණික විපර්යාසවලට ඇති ඉහළ අවදානම

- කෘෂිකාර්මික ප්‍රදේශවල මිනිස්-සත්ව ගැටුම් පැවතීම.

අනාගත ඉලක්ක

- ශ්‍රී ලාංකීය වී ගොවීන් සඳහා සුදුසු විවිධ වයස් කාණ්ඩ යටතේ වී ප්‍රභේද හා උචිත තාක්ෂණයන් ජනනය කිරීම ප්‍රධාන අරමුණට අනුව අවම යෙදවුම් සහිතව, රෝග පළිබෝධවලට ඔරොත්තු දෙන, පාරිසරික ආතතීන්ට ඔරොත්තු දෙමින් ඉහල ධාන්‍ය ගුණාත්මයෙන් යුතු වී වර්ග නිපදවීම ඉලක්ක කරගත් වී අභිජනන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

- අභිජනනය මගින් ඉහළ ධාන්‍ය ගුණාත්මයෙන් යුතු වී වර්ග නිපදවීම හා සහල් ආශ්‍රිත කර්මාන්ත සඳහා සුදුසු වී වර්ග නිපදවීම.

- සියලු බෝග වල වඩා හොඳ ගුණාත්මක ලක්ෂණ සහිත නව ප්‍රභේද හඳුන්වා දීම හා ඵලදායිතාවය ඉහළ නැංවීම.

- හරිත කෘෂිකර්මය සඳහා සුදුසු වන තාක්ෂණයන් ජනනය කරමින් රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සුරක්ෂිත ආහාර නිෂ්පාදනයක් කරා ගමන් කිරීම. වඩා කාර්යක්ෂම කොම්පෝස්ට් නිෂ්පාදනය මගින් ශාක පෝෂක අවශ්‍ය ප්‍රමාණවලින් අවශ්‍ය වර්ධන අවස්ථාවේදී ලබා දීමෙන් අස්වනු හානිය අවම කරගැනීම සඳහා වූ අභියෝග ජය ගැනීමට අවශ්‍ය පර්යේෂණ සිදු කිරීම.

- ඉහළ අස්වැන්නක් ලබා දෙන උසස් තත්ත්වයේ, දේශීයව නිෂ්පාදනය කරන ලද දෙමුහුන් සහ විවෘත පරාගනය කරන ලද එළවළු වර්ග බෝ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම හා බීජ සුලබතාව ඉහළ නැංවීම.

- වැඩිදියුණු කළ බෝග වර්ගවල ගුණාත්මක බීජ ප්‍රමාණවත් ලෙස සැපයීම සහතික කිරීම.

- වී වගාවේ ක්ෂේත්‍ර කටයුතු යාන්ත්‍රීකරණය සඳහා දිරි ගැන්වීමට අවශ්‍ය තාක්ෂණයන් හඳුන්වා දීම.

- බෝග වල රෝග සහ පලිබෝධ පාලනය කිරීම සඳහා නව පරිසර හිතකාමී තාක්ෂණයන් සහ ක්‍රම උත්පාදනය කිරීම.

- උසස් තත්ත්වයේ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රවර්ධනය සඳහා යෝග්‍ය තාක්ෂණයන් හඳුනා ගැනීම.

- කාබනික වගාව සඳහා සුදුසු තාක්ෂණික පැකේජ ලබා දීම.

- දේශීය සහ අපනයන වෙළෙඳපොළ සඳහා ඉහළ විභවයක් ඇති ආහාර නිෂ්පාදන හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම.

- උසස් තත්ත්වයේ සුරක්ෂිත ආහාර භෝග ලබා ගැනීමට පාරිභෝගිකයින්ට අවස්ථාව සැලසීම.

- ආයතනයේ මානව සම්පත් ධාරිතාව වැඩි දියුණු කිරීම.

- බෝග නිෂ්පාදනය පහසු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පවතින සමාජ ආර්ථික හා ක්ෂේත්‍ර තත්ත්වයන්ට ගැළපෙන ඵලදායී කෘෂිකාර්මික යාන්ත්‍රික තාක්ෂණයන් සංවර්ධනය කිරීම

- තාක්ෂණික නවෝත්පාදනයන් පුළුල් ලෙස භාවිතා කිරීමට පහසුකම් සැලසීම.

- පස් පරීක්ෂා කර පොහොර භාවිතා කිරීම කාබනික පොහොර භාවිතය මගින් පස දියුණු කිරීම මගින් ඉහල ශාක පෝෂක කළමනාකරණයක් සහිතව ලාබදායීව වී ගොවිතැන සිදු කිරීමට අවශ්‍ය තාක්ෂණයන් ජනනය කිරීම.

- පාංශු සංරක්ෂණය සහ ජල කළමනාකරණය පිළිබඳ පර්යේෂණ සහ තාක්ෂණික දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගනිමින් ක්ෂේත්‍රයේ පාංශු හා ජල සංරක්ෂණ කටයුතු පුළුල් කිරීම.

- රජයේ නව ප්‍රතිපත්තියට අනුව හරිත කෘෂිකර්මාන්තයට උචිත නව තාක්ෂණයන් උත්පාදනය කිරීම මගින් සුරක්ෂිත ආහාර නිෂ්පාදනය සහතික කිරීම සහ කාර්යක්ෂම

කොම්පෝස්ට් නිෂ්පාදනය තුළින් නිවැරදි වර්ධන අවධියේදී අවශ්‍ය ප්‍රමාණයට ශාක පෝෂණය ලබා දීමෙන් අස්වනු හානි අවම කිරීම.

- බීජ පරීක්ෂණාගාර යටතේ බීජ වල ගුණාත්මය ඇගයීම - දැනට බීජ සහතික කිරීමේ සේවය යටතේ සහතික කිරීමට ලක්නොවන බීජවල ගුණාත්මය බීජ පරීක්ෂණාගාරය යටතේ පරීක්ෂා කර දීම.

- වී, අතිරේක ආහාර බෝග, එළවළු, පලතුරු වල බීජවල ගුණාත්මය, බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුකූලව ක්ෂේත්‍ර සහතික කිරීම හා බීජ පරීක්ෂණාගාර තත්ත්ව යටතේ පරීක්ෂා කිරීම, තොග විඛණ්ඩනය හා ගබඩා කරන ලද තොගවල ගුණාත්මය පරීක්ෂාවට බඳුන් කිරීම, අභිජනන බීජ කාණ්ඩයේ බීජ වල ගුණාත්මය තහවුරුකිරීම, ඩී.යූ.එස්.පරීක්ෂාව සිදු කිරීම, ආනයනික බීජ දේශීය වෙළඳපොළ තුළ අලෙවිය සඳහා නාමකරණයන් ලබාදීම, ආරක්ෂිත ගෘහ යටතේ වගා කරනු ලබන බෝග සහතික කිරීම සඳහා ප්‍රමිතීන් සකස් කිරීම, බිම්මල් බීජ සහතික කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම හා පාරම්පරික වී ප්‍රභේද වල බීජ වල ගුණාත්මය තහවුරු කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

- බීජ පනතට අදාළ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සහ බීජ පනතේ සියලුම ක්‍රියාකාරකම් වැවිලි බෝග, මල් සහ අපනයන බෝග සඳහා ද ව්‍යාප්ත කිරීම.

- ගුණාත්මක බීජ නිෂ්පාදනය සහ තත්ත්ව සහතිකය සඳහා අවශ්‍ය තාක්ෂණයන් නිෂ්පාදනය කිරීම සහ බීජ සඳහා අදාළ සියලුම පර්යේෂණ පැවැත්වීම.

- බීජ නිෂ්පාදකයින්, බීජ අලෙවිකරුවන් සහ තවාන් හිමියන් ඇතුළු සියලුම බීජ සහ රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් සඳහා දේශීයව හා විදේශීයව පුහුණුව ලබා දීම.

- ගුණාත්මය තහවුරු කරන ලද බද්ධ පලතුරු පැළ සහතික කිරීම, මව්ශාක සහතික කිරීම හා ඒවාට අදාළ GPS දත්ත ලබා ගනිමින් සිතියම් ගත කිරීමේ කාර්යාවලිය තවදුරටත් පුළුල් කිරීම.

- දැනට බීජ සහතික කිරීමේ සේවයේ ලේබල් නොයොදන, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ හෝ නිදහස් කරන ලද ප්‍රභේදවල අතුපැළ, බීජ පැළ හා ලේයර් පැළ හා පටක රෝපිත පැළ සහතික කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරන ගොවිපල සංඛ්‍යාව වැඩි කිරීම සහ අර්තාපල්, බිම්මල් සහ අතිරේක ආහාර බෝග වෙනුවෙන් යහපත් කෘෂිකාර්මික භාවිතයන් සඳහා ප්‍රමිතීන් සකස් කිරීම.

- පරිසර හිතකාමී පළිබෝධ පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම

- ශ්‍රී ලංකාවේ ජාතික ශාක ආරක්ෂණ පද්ධතිය ශක්තිමත් කිරීම

- පළිබෝධ ආවේක්ෂණය, පුරෝකථනය සහ වසංගත කළමනාකරණය පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් සහ දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම.

- විදේශීය ආක්‍රමණශීලී ශාක විශේෂ නිසි කලට කළමනාකරණය කිරීම සඳහා ක්‍රම හඳුනා ගැනීම

- පළිබෝධකයන් හඳුනා ගැනීම සඳහා නිවැරදි හා ඉක්මන් ක්‍රම හඳුන්වා දීම.

- පළිබෝධ අවදානම් පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සහ නිෂ්කාශනය සඳහා කරුණු ඉදිරිපත් කිරීම මගින් ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සැලසීම.

- වඩාත් ඵලදායී නිරෝධායන සේවාවක් ලබා දෙමින් රටේ විදේශ විනිමය ශක්තිමත් කිරීමට පියවර ගැනීම.

- ශාක නිරෝධායන සේවා ස්වයංක්‍රියකරණය.

- ආහාර බෝග සහ අනෙකුත් ආර්ථික/ ජෛව විද්‍යාත්මකව වැදගත් බෝග වල ශාක ජාන සම්පත් ක්‍රමානුකූලව සංරක්ෂණය කිරීම

- දේශීය භාවිතය සඳහා ශාක ජාන සම්පත් එකතූන් පුළුල් කිරීම


- පළාත් මට්ටමින් පළිබෝධනාශක පාලන පනත ක්‍රියාත්මක කිරීම සවිමත් කිරීම.

- පළිබෝධනාශක අවභාවිතය අවම කිරීම සඳහා කෘෂිකාර්මික උපදේශකවරයෙකුගේ නිර්දේශයකින් තොරව පළිබෝධනාශක මිලදී ගැනීම වැළැක්වීමට නීති සකස් කිරීම සහ පළිබෝධනාශක අලෙවිසැල්වලට පුහුණුවන්නන් අනුයුක්ත කිරීම.

- පළිබෝධනාශක පාලන පනතේ පවතින අඩුපාඩු සංශෝධනය කිරීම (සංශෝධන දැනටමත් කෙටුම්පත් කර ඇත) සහ පරිපාලනය තවදුරටත් විධිමත් කිරීම.

- නව තාක්ෂණයන් උත්පාදනය කිරීම සහ අනුගමනය කිරීම සහ හොඳ අලෙවිකරණ උපාය මාර්ග තුළින් පසු අස්වනු හානි අවම කිරීම තුළින් ගොවිපල ආදායම කිහිප ගුණයකින් ඉහළ නැංවීම.

- සැකසුම් සහ අගය එකතු කිරීම් හරහා කෘෂිකාර්මික නිෂ්පාදනවලින් ලැබෙන අපනයන ආදායම වැඩි කිරීම සඳහා කටයුතු සැලසීම.



පරිච්ඡේදය 03 - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ -එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය	
-	**ආදායම් ලැබීම්**			-	
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ - 1
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-		
	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-		
400,000,000	බදු නොවන ආදායම් සහ වෙනත්	4	567,969,837	488,134,208	
400,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**567,969,837**	**488,134,208**	
	ආදායම් නොවන ලැබීම්		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		5,784,067,000	5,622,096,000	ඒසිඒ - 3
-	තැන්පතු		349,358,747	240,601,077	ඒසිඒ - 4
-	අත්තිකාරම් ගිණුම්		1,160,230,585	970,919,369	ඒසිඒ-5/5(ඒ)/5(බී)
-	වෙනත් ප්‍රධාන ලේජර් ගිණුම් ලැබීම්		-	540,931,080	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**7,293,656,332**	**7,374,547,526**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ =(අ) + (ආ)**		**7,861,626,169**	**7,862,681,734**	
	අඩු කළා: වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	
4,655,569,265	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	4,349,040,301	4,447,111,936	
369,725,471	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	293,295,113	285,629,221	ඒසිඒ-2(II)
48,000,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	44,062,473	102,312,173	
-	පොලී ගෙවීම්	8	-	-	
395,264	වෙනත් පුනරාවර්තන වියදම්	9	395,264	-	
5,073,690,000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		**4,686,793,151**	**4,835,053,330**	

	මූලධන වියදම්				
	මූලධන වත්කම්				
200,200,000	පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	158,188,936	107,408,035	
146,600,000	මූලධන වත්කම් අත්පත් කරගැනීම	11	115,430,923	83,208,794	ඒසිඒ-2(II)
-	ප්‍රග්ධන පැවරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම	13	-	-	
15,000,000	හැකියා වර්ධනය	14	8,515,057	2,696,424	
1,785,000,000	වෙනත් මූලධන වියදම්	15	1,267,410,593	785,625,710	
2,146,800,000	**මුළු මූලධන වියදම් (උ)**		1,549,551,508	978,938,963	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**1,312,739,017**	**1,261,387,704**	ඒසිඒ-4
	තැන්පතු ගෙවීම්		298,408,690	233,787,750	ඒසිඒ-5/5(අ)
	අත්තිකාරම් ගෙවීම්		1,014,330,327	1,027,599,954	
	මුළු වියදම උ =(ඇ+උ+ඌ)		**7,549,083,676**	**7,075,379,997**	
	2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ =(ඇ-උ)		**312,542,493**	**787,301,737**	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය


ඒසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය වර්තමාන ශේෂය රු.	ඉකුත් වර්ෂය රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	ඒසිඒ - 6	26,492,456,495	24,525,447,790
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ -5/5(අ)	564,089,059	709,998,521
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ - 3	-	-
මුළු වත්කම්		27,056,545,554	25,235,446,311
ශුද්ධ වත්කම්/ස්කන්ධය			
ශුද්ධ වත්කම්		(1,941,880)	197,484,689
දේපල, පිරියත හා උපකරණ		26,492,456,495	24,525,447,790
සංචිතය	ඒසිඒ -5(ආ)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	566,030,939	512,513,832
අග්‍රිම ශේෂය	ඒසිඒ - 3	-	-
මුළු වගකීම්		**27,056,545,554**	**25,235,446,311**

පිටු අංක 4 සිට 57 දැක්වෙන ඉහත ඒසීඒ1 සිට ඒසීඒ6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 62 සිට 143 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ බවටත් මෙයින් සහතික කරමු.



3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තක්‍ෂ	
	වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	567,969,837	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	1,029,065,287
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	539,868,465	-
අග්‍රිම ලැබීම්	5,784,067,000	5,622,096,000
අත්තිකාරම් අයකරගැනීම්	1,163,599,363	975,298,019
තැන්පතු ලැබීම්	349,358,747	240,601,077
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (අ)	**8,404,863,412**	**7,867,060,393**
අඩු කළා - මුදල් වැය කිරීම් :		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	4,641,593,129	4,729,330,732
සහනාධාර සහ මාරුකිරීම් වියදම්	44,457,737	43,993,255
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	881,405,727	758,110,256
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	53,812,759
අත්තිකාරම් ගෙවීම්	1,013,889,320	1,027,345,806
තැන්පතු ගෙවීම්	298,408,690	233,787,750
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**6,879,754,603**	**6,846,380,558**

මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් (ඇ)= (අ)-(ආ)	**1,525,108,809**	**1,020,679,825**
<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම උපණය අයකර ගැනීම	-	-
අත්තිකාරම් අයකර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඈ)	-	-
<u>අඩු කළා - මුදල් වැය කිරීම් :</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	1,525,108,809	1,034,089,513
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	1,525,108,809	1,034,089,513
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ)- (ඉ)	(1,525,108,809)	(1,034,089,513)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ)- (ඊ)	-	(13,409,688)
<u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩු කළා - මුදල් වැය කිරීම් :</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) – (එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) – (ඒ)	-	(13,409,688)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		13,333,278
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		(76,409)

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

නැත.

3.5 ආදායම් එකතු කිරීමේ සාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.02.18	විකුණුම් හා ගාස්තු	350,000,000	400,000,000	567,969,837	141.99

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	5,073,690.00	386,896.849	4,686,793.151	92.37
මූලධන	7,073,785.00	450,543.491	1,549,551.508	77.47

3.7 මු.රෙ. 208 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. , 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන , ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	118 - කෘෂිකර්ම අමාත්‍යාංශය	සෞභාග්‍යා දැක්ම අත්කර ගැනීම වෙනුවෙන්	7,022.515	7,022.515	6,530.571	92.99
2	425 - කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය	සෞභාග්‍යා කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන	1,444,697.598	1,449,697.598	1,269,405.535	87.56
3	160 - පරිසර අමාත්‍යාංශය	රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව බුද්ධශාසන අමාත්‍යාංශයය විසින් කරන රුක් රෝපණ වැඩසටහන	600.00	600.00	600.00	100

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන , ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
4	130 - රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	2019 වර්ෂයේ බඳවාගත් උපාධිධාරි පුහුණු නිලධාරින් සඳහා දීමනා ගෙවීම	3,000.00	3,000.00	2,785.33	92.84
5	237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව		1,035.00	1,035.00	770.00	74.39

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. , 000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2021** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		6,354,801.415		
9152	යන්ත්‍රෝපකරණ		25,187,410.88		
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව: ඇමුණුම I

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1.1 වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	75% - 89%	50% - 74%
1. ස්ථාපනය කරන ලද තොග ගහණ සංඛ්‍යාව, අස්වනු අත්හදා බැලීම් සංඛ්‍යාව සහ මූලික අත්හදා බැලීම් සංඛ්‍යාව	√		
2. නිෂ්පාදනය කරන ලද නිර්දේශිත වී ප්‍රභේදවල අභිජනන බීජ ප්‍රමාණය	√		
3. පෛව අපෛව ආතතීන්ට ඔරොත්තු දෙන වී ආර ඉහළ නැංවීම සඳහා පෛව තාක්ෂණය ආශ්‍රිත අත්හදා බැලීම් සංඛ්‍යාව	√		
4. වී අස්වැන්න සහ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා සිදුකරන ලද ශෂ්‍ය විද්‍යාත්මක අත්හදා බැලීම් සහ තාක්ෂණික පැකේජ සංඛ්‍යාව	√		
5. වී වගාවේ දී පාංශු සහ ජල කළමනාකරණය සම්බන්ධයෙන් සිදුකරන ලද ව්‍යාධිවිද්‍යාත්මක අත්හදා බැලීම් සංඛ්‍යාව	√		
6. පලිබෝධ හානිවලින් වී බෝගය තවදුරටත් ආරක්ෂා කිරීම සඳහා මෙහෙයවන ලද කීට විද්‍යා අත්හදා බැලීම් සංඛ්‍යාව	√		
7. වී බෝගයේ වැළඳෙන විවිධ රෝග සඳහා ප්‍රතිරෝධීතාව ඉහළ නැංවීම සඳහා මෙහෙයවන ලද අත්හදා බැලීම් සංඛ්‍යාව	√		
8. වී වගාවේ දී වල් පැල පාලනය සම්බන්ධයෙන් සිදු කරන ලද අත්හදා බැලීම් සංඛ්‍යාව	√		
9. ධාන්‍ය ගුණාත්මය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව	√		
10. බීජ වී නිෂ්පාදනය සඳහා වගා කළ බිම් ප්‍රමාණය	√		
11. ක්ෂේත්‍ර නිලධාරීන්, ගොවීන් සහ ශිෂ්‍යයන් සඳහා මෙහෙයවන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව		√	

4.1.2 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	75% - 89%	50% - 74%
1. බිහි කරන ලද අතිරේක ආහාර බෝග ප්‍රභේද සංඛ්‍යාව	√		
2. වියළි කලාපය සඳහා සුදුසු ලෙස හඳුනාගන්නා ලද සහ බිහි කරන ලද එළවළු සහ පළතුරු බෝග/ ප්‍රභේද සංඛ්‍යාව	√		
3. බෝග ප්‍රවර්ධනයේ දී කාර්යක්ෂම ලෙස භාවිතා කරන ලද ජෛව තාක්ෂණික මෙවලම් සංඛ්‍යාව	√		
4. අතිරේක ආහාර බෝගවල පලිබෝධ හා රෝග පාලනය කිරීමට බිහි කරන ලද තාක්ෂණික ක්‍රම සංඛ්‍යාව	√		
5. වියළි කලාපයේ බෝග ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා බිහි කරන ලද ශෂ්‍ය විද්‍යාත්මක තාක්ෂණික ක්‍රම සංඛ්‍යාව	√		
6. වියළි කලාපය සඳහා බිහි කරන ලද පාංශු කළමනාකරණ තාක්ෂණික ක්‍රමෝපායයන් සංඛ්‍යාව	√		
7. වියළි කලාපයේ ජල ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා බිහි කරන ලද තාක්ෂණික ක්‍රමෝපායයන් සංඛ්‍යාව	√		
8. අතිරේක ආහාර බෝගවල ඵලදායිතාව කෙරෙහි දේශගුණික වෙනස්වීම්වල බලපෑම පිළිබඳ සිදු කරන ලද අධ්‍යයන සංඛ්‍යාව	√		
9. ශ්‍රී ලංකාවේ විවිධ කලාපවල පවත්නා සමාජ ආර්ථික හා ක්ෂේත්‍ර තත්ත්ව සමඟ ගැළපෙන පරිදි බිහිකරන ලද ඵලදායි කෘෂිකාර්මික යාන්ත්‍රීකරණ තාක්ෂණයන් සංඛ්‍යාව	√		
10. වියළි කලාපයේ එළවළු /පළතුරු සහ නිර්දේශිත අතිරේක ආහාර බෝගවල අභිජනන බීජ /රෝපණ ද්‍රව්‍යවල නිෂ්පාදිත ප්‍රමාණ	√		
11. පාර්ශවකරුවන් වෙත බෙදා හරින ලද කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රමෝපායයන් සංඛ්‍යාව	√		

4.1.3 උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	75% - 89%	50% - 74%
1. බිහි කරන ලද ඉහළ අස්වනු දෙන එළවළු, අල බෝග ප්‍රභේද සංඛ්‍යාව	√		
2. බෝග ප්‍රභේදවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා හඳුනාගන්නා ලද ප්‍රශස්ත ශෂ්‍ය විද්‍යාත්මක භාවිතාවන් සංඛ්‍යාව	√		
3. එළවළු වගා පද්ධති සඳහා පරිසර හිතකාමී පලිබෝධ හා රෝග පාලන කළමනාකරණ තාක්ෂණික ක්‍රමෝපායයන් සංඛ්‍යාව	√		
4. නිෂ්පාදනය කරන ලද ආරම්භක අභිජනන බීජ ප්‍රමාණය	√		
5. ඵලදායි ලෙස ව්‍යාප්ත කරන ලද බිහි කරන ලද තාක්ෂණික ක්‍රමවේද සංඛ්‍යාව	√		
6. පවතින අගය එකතු කරන ලද එළවළු නිෂ්පාදන සංඛ්‍යාව	√		
7. වැඩිදියුණු කරන ලද පූර්ව /පශ්චාත් අස්වනු තාක්ෂණ කළමනාකරණ භාවිතාවන් සංඛ්‍යාව	√		
8. කාබනික එළවළු නිෂ්පාදනය සඳහා බිහි කරන ලද කළමනාකරණ පැකේජ සංඛ්‍යාව	√		
9. ආහාර සුරක්ෂිතාව තහවුරු කිරීම සඳහා ආහාර දූහක විශ්ලේෂණය / විශ්ලේෂණ සඳහා කරනු ලබන ආහාර දූහක සංඛ්‍යාව	√		

4.1.4 පළතුරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	75% - 89%	50% - 74%
1. බිහි කරන ලද ප්‍රභේද /ප්‍රමුඛ දර්ශ/ තාක්ෂණික ක්‍රම සංඛ්‍යාව		√	
2. 80%ට වැඩි ප්‍රගතියක් සහිත පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව	√		
3. 80%ට වැඩි ප්‍රගතියක් සහිත සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව	√		
4. සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	√		
5. පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව	√		
6. නියමිත වේලාවට භාරදෙන ලද පර්යේෂණ/ කාර්යසාධන/ ප්‍රගති වාර්තා සංඛ්‍යාව	√		
7. සම්පත්දායක පුද්ගලයන්ගේ සහභාගිත්වයෙන් පැවැත් වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	√		

4.1.5 ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	75% - 89%	50% - 74%
1. සපයන ලද කෘෂි -කාලගුණ විද්‍යා උපදේශන සංඛ්‍යාව	√		
2. සපයන ලද කාලගුණික තත්ත්ව දැනුම් දීමේ පණිවුඩ සංඛ්‍යාව	√		
3. සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව	√		
4. සකසන ලද පාංශු සංරක්ෂණ සහ භූමියේ උචිතතාව පිළිබඳ සිතියම් සංඛ්‍යාව	√		
5. පත් කරන ලද බලය ලත් නිලධාරීන් සංඛ්‍යාව	√		
6. ස්ථාපනය කළ මාර්ගස්ථ පුවරු සංඛ්‍යාව	√		
7. සිදු කරන ලද තාක්ෂණික ව්‍යාප්ති වැඩසටහන් සංඛ්‍යාව	√		

4.1.6 බීජ සහතිකකිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	75% - 89%	50% - 74%
බීජ සහතික කිරීමේ සේවය			
1. සහතික කරන ලද අභිජනන බීජ ප්‍රමාණය	√		
2. නිර්දේශ කරන ලද වෙනත් පංතිවල (මූලික, සම්මත, පදනම්, ලියාපදිංචි සහ සහතික) බීජ ප්‍රමාණ - බිත්තර වී		√	
3. නිර්දේශ කරන ලද වෙනත් පංතිවල (මූලික, සම්මත, පදනම්, ලියාපදිංචි සහ සහතික) බීජ ප්‍රමාණ - අතිරේක ආහාර බෝග			√
4. නිර්දේශ කරන ලද වෙනත් පංතිවල (මූලික, සම්මත, පදනම්, ලියාපදිංචි සහ සහතික) බීජ ප්‍රමාණ - එළවළු			√
5. සහතික කරන ලද බීජ අර්තාපල් ප්‍රමාණය	√		
6. ලියාපදිංචි කරන ලද තවාන් සංඛ්‍යාව	√		
7. ලේබල් කරන ලද පළතුරු පැළ සංඛ්‍යාව	√		
8. සහතික කරන ලද මව් ශාක සංඛ්‍යාව		√	
9. සිදුකරන ලද DUS පරීක්ෂණ සංඛ්‍යාව	√		

10. පශ්චාත් පාලක ක්ෂේත්‍ර තුළ අත්හදාබැලීම් වශයෙන් පරීක්ෂා කරන ලද නියැදි සංඛ්‍යාව			√
11. බීජ පරීක්ෂණ විද්‍යාගාරවල ප්‍රරෝහණය , ආර්ද්‍රතාව සහ පාරිශුද්ධතාව සඳහා පරීක්ෂා කරන ලද නියැදි සංඛ්‍යාව			√
12. බීජ මගින් ව්‍යාප්ත වන රෝග සඳහා පරීක්ෂා කරන ලද නියැදි සංඛ්‍යාව			√
13. සී නියැදි වශයෙන් පරීක්ෂා කරන ලද තොග සංඛ්‍යාව	√		
14. වෙන් කරන ලද නියැදි සංඛ්‍යාව			√
15. සිදු කරන ලද නාමකරණ සංඛ්‍යාව			√
16. ලියාපදිංචි කරන ලද බීජ හසුරුවන්නන් සංඛ්‍යාව		√	
17. නැවත අළුත් කරන ලද බීජ ලියාපදිංචිකරුවන් සංඛ්‍යාව		√	
18. විමර්ශනය කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව	√		
19. අනුමත කරන ලද ලේබල් සංඛ්‍යාව			√
20. නිරීක්ෂණය කරන ලද පරිශ්‍ර සංඛ්‍යාව	√		
21. සහතික කරන ලද GAP ගොවිපළ සංඛ්‍යාව	√		
22. මෙහෙයවන ලද පුහුණු කිරීම් සංඛ්‍යාව	√		
පැළෑටි සංරක්ෂණ සේවය			
1. 1999 අංක 35 දරණ ශාක ආරක්ෂණ පනත යටතේ අළුතෙන් පත් කරන ලද බලයලත් නිලධාරීන් සංඛ්‍යාව			√
2. IPM, PCCP,IAS සහ කෘන්තකයන් පාලනය යටතේ පුහුණු කරන ලද ගොවීන් සහ නිලධාරීන් සංඛ්‍යාව	√		
3. නිදහස් කරන ලද ජෛව විද්‍යාත්මක පාලන කාරක සංඛ්‍යාව			√
4. ඓතිහාසික වශයෙන් වැදගත්වන ස්ථානවල පලිබෝධ ව්‍යාප්තිය පාලනය, වේයන් පාලනය සහ පලිබෝධ පාලනය යටතේ මෙහෙයවන ලද වැඩසටහන් සංඛ්‍යාව	√		
5. පරීක්ෂා කරන ලද වල් පැළෑටිනාශක සහ වේ නාශක සංඛ්‍යාව	√		
පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය			
1. අගයන ලද පලිබෝධනාශක සංඛ්‍යාව	√		

2. පලිබෝධනාශක ආරක්ෂාකාරී භාවිතය සහ නීත්‍යානුකූල වෙළඳාම පිළිබඳ පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව සහ පලිබෝධනාශක ආශ්‍රිත දත්ත රැස් කිරීම සහ සම්පාදනය	√		
3. පවත්වන ලද අනුකූලතා මෙහෙයුම් (නිෂ්පාදන ගුණත්වය සහ පාරිසරික අංශවල අවශේෂ සහ 1980 අංක 33 දරණ පලිබෝධනාශක පාලන පනත උල්ලංඝනය කිරීමට විරුද්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග) වැඩසටහන් සංඛ්‍යාව	√		
4. අභ්‍යන්තර හා අන්තර් දෙපාර්තමේන්තුමය රැස්වීම්වලට සහභාගි වූ තාක්ෂණික විශේෂඥ සාමාජිකයන් /සම්පත්දායකයන් සංඛ්‍යාව	√		
පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය			
1. ගවේෂණ මගින් සහ පර්යේෂණ ආයතනවලින් රැස් කර ගන්නා ලද ජාන ප්ලාස්ම සංඛ්‍යාව		√	
2. බෙදා හරින ලද බීජ ද්‍රව්‍ය සංඛ්‍යාව			√
3. ලාක්ෂණීකරණය කරන ලද ජාන ප්ලාස්ම සංඛ්‍යාව	√		
4. අගයන ලද ජාන ප්ලාස්ම සංඛ්‍යාව			√
5. ගුණනය කර සංරක්ෂණය සඳහා ලබා දුන් අණුක්‍රමික සංඛ්‍යාව		√	
6. පවත්වන ලද අණුක පර්යේෂණ සංඛ්‍යාව		√	
7. දත්ත පද්ධතියට ඇතුලත් කර ඇති දත්ත සංඛ්‍යාව			√
ජාතික ශාක නිරෝධායන සේවය			
1. අපනයනය කරන ලද තත්ත්වයෙන් උසස් පලිබෝධයන්ගෙන් තොර ශාක සහ ශාක නිෂ්පාදන සංඛ්‍යාව	√		
2. දිවයිනෙහි ශාක නිරෝධායන ආනයන අවශ්‍යතාවයට අනුකූල ලෙස ආනයනය කරන ලද ශාක සහ ශාක නිෂ්පාදන	√		
3. නිරෝධායනය ආශ්‍රිතව මෙහෙයවන ලද පර්යේෂණ සංඛ්‍යාව			√
4. පාර්ශ්වකරුවන් සඳහා මෙහෙයවන ලද පුහුණු හා වැඩසටහන් සංඛ්‍යාව	√		
5. නිරෝධානය නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩමුළු සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව			√

4.1.7 බීජ සහ රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	75% - 89%	50% - 74%
1. ගොවිපල්වල නිෂ්පාදිත අත්තිවාරම් බීජ වී ප්‍රමාණය	√		
2. ගොවිපල්වල නිෂ්පාදිත ලියාපදිංචි කරන ලද බීජ වී ප්‍රමාණය			√
3. කොන්ත්‍රාත් වගාව යටතේ නිෂ්පාදිත ලියාපදිංචි සහ සහතික කරන ලද බීජ වී ප්‍රමාණය			√
4. ගොවිපල්වල නිෂ්පාදිත අත්තිවාරම් සහ ලියාපදිංචි අතිරේක ආහාර බෝග බීජ ප්‍රමාණය			√
5. කොන්ත්‍රාත් වගාව යටතේ නිෂ්පාදිත ලියාපදිංචි සහ සහතික කරන ලද අතිරේක ආහාර බෝග බීජ ප්‍රමාණය	√		
6. ගොවිපල්වල නිෂ්පාදිත මූලික එළවළු බීජ ප්‍රමාණය			√
7. ගොවිපල්වල නිෂ්පාදිත සම්මත එළවළු බීජ ප්‍රමාණය			√
8. ගොවිපල්වල නිෂ්පාදිත දෙමුහුම් එළවළු බීජ ප්‍රමාණය			√
9. කොන්ත්‍රාත් වගාව යටතේ නිෂ්පාදිත සම්මත එළවළු බීජ ප්‍රමාණය	√		
10. පොලි ගෘහ තුල නිෂ්පාදිත පෙර මූලික (G_0) අර්තාපල් බීජ ප්‍රමාණය (සංඛ්‍යාව)			√
11. පොලි ගෘහ තුල නිෂ්පාදිත මූලික (G_1) අර්තාපල් බීජ ප්‍රමාණය (මෙ.ටො.)	√		
12. ගොවිපල්වල නිෂ්පාදිත මූලික (G_1,G_2 සහ G_3) අර්තාපල් බීජ ප්‍රමාණය	√		
13. ගොවිපල්වල නිෂ්පාදිත සහතික කරන ලද අර්තාපල් බීජ (C_1 සහ C_2) ප්‍රමාණය	√		
14. ගොවිපල්වල නිෂ්පාදිත බද්ධ පැළ සංඛ්‍යාව			√
15. ගොවිපල්වල නිෂ්පාදිත බීජ පැළ සංඛ්‍යාව	√		
16. ගොවිපල්වල නිෂ්පාදිත මුල් අද්දන ලද දඬු කැබලි සංඛ්‍යාව			√
17. ගොවිපල්වල නිෂ්පාදිත මොරෙයියන් සංඛ්‍යාව			√
18. ගොවිපල්වල නිෂ්පාදිත එළවළු බදුන් සංඛ්‍යාව			√

4.1.8 සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	75% - 89%	50% - 74%
1. පිළියෙල කරන ලද පර්යේෂණ වාර්තා සංඛ්‍යාව			√
2. පළ කරන ලද පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව	√		
3. නිකුත් කරන ලද AgStat, COC, බෝග පුරෝකථන සංඛ්‍යාව	√		
4. අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව		√	
5. පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව		√	
6. යවාත්කාලීන කරන ලද Croplook.net වෙබ් අඩවි සංඛ්‍යාව	√		

4.1.9 ව්‍යාප්ති සහ පුහුණු මධ්‍යස්ථානය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	75% - 89%	50% - 74%
1. පවත්වන ලද ක්ෂේත්‍ර දින සංඛ්‍යාව *			
2. සිදු කරන ලද ආදර්ශන සංඛ්‍යාව			√
3. පවත්වන ලද බෝග සායන සංඛ්‍යාව*			
4. ගොවීන් සඳහා පවත්වන ලද පුහුණු පංති සංඛ්‍යාව	√		
5. කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 06) සඳහා ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව (2019/2020) **			
6. කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 05) සඳහා ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව (2019/2020) **			
7. ඩිප්ලෝමා සහතික ලබා ගත් සිසුන් සංඛ්‍යාව	√		
8. ඩිප්ලෝමා පාඨමාලා පිළිබඳව පවත්වනලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව *			
9. කෘෂිකර්ම විද්‍යාල වල විගණන ක්‍රමවේදය සඳහා නිරීක්ෂණ චාරිකා සංඛ්‍යාව			√

10. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරින් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව*			
11. ගොවින් සහ ව්‍යවසායකයන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව*			
12. වෙනත් පළාත් පාලන ආයතන නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව		√	
13. NVQ 04 පාඨමාලා හැදෑරූ ශිෂ්‍යයන් සංඛ්‍යාව***			
14. පවත්වන ලද තාක්ෂණික වැඩ කණ්ඩායම් (PTWG සහ MTWG) සැසි සංඛ්‍යාව***			
15. පවත්වන ලද පූර්ව -කන්නමය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව ***			
16. විශ්ව විද්‍යාල සිසුන්, ඩිප්ලෝමා ආයතන සහ පාසල් සිසුන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව *			
17. NVQ 06 පාඨමාලා සඳහා පවත්වන ලද පරීක්ෂණ සංඛ්‍යාව (මාස 6 සහ වාර්ෂ අවසාන)			√
18. NVQ 05පාඨමාලා සඳහා පවත්වන ලද පරීක්ෂණ සංඛ්‍යාව (මාස 6 සහ වාර්ෂ අවසාන)*			
19. උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා පවත්වන ලද නිපුණතාවය පදක ඇගයීම් සංඛ්‍යාව	√		
20. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවකයින් සඳහා පවත්වන ලද කාර්යක්ෂමතා කඩයීම් විභාග සංඛ්‍යාව			√
21. ආර්ථික විද්‍යාඥ සහකාර නිලධාරීන් බඳවා ගැනීම සඳහා පවත්වන ලද විභාග සංඛ්‍යාව*			
22. එළවළු හා පලතුරු සඳහා ස්ථාපිත ඇසුරුම් ගෘහ සංඛ්‍යාව			√
23. 50% ගොවි දායකත්වය යටතේ ද්‍රව්‍ය බෙදා හැරීම සඳහා ස්ථාපිත ගොවි සමුපකාර සමිති සංඛ්‍යාව		√	
24. ස්ථාපනය කරන ලද GAP සහතිකකරණ ගොවිපළ සංඛ්‍යාව			√
25. විභව ව්‍යවසායකයන් සඳහා පවත්වන ලද ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් සංඛ්‍යාව		√	

26. ස්ථාපනය කරන ලද GAP අලෙවිසැල් සංඛ්‍යාව			√
27. ස්ථාපනය කරන ලද GAP වෙළඳ දැන්වීම් පුවරු සංඛ්‍යාව			√
28. නවීකරණය කරන ලද GAP වෙළඳ දැන්වීම් පුවරු සංඛ්‍යාව			√
29. අලෙවි සැල් හරහා අගය එකතු කරන ලද නිෂ්පාදන අලෙවි කිරීම සඳහා කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයන්ට සහාය ලබා දුන් අවස්ථා සංඛ්‍යාව *			
30. මඤ්ඤොක්කා අගය එකතු කරන ලද නිෂ්පාදන සඳහා පිහිටුවන ලද ගොවි කණ්ඩායම් සංඛ්‍යාව	√		

*ප්‍රගතිය 50%ට අඩුය.

**කොවිඩ් 19 වසංගත තත්වය නිසා NVQ 05/ NVQ 06 ඩිප්ලෝමා පාඨමාලාව සඳහා කිසිදු ශිෂ්‍යයෙකු ලියාපදිංචි වී නොමැත.

*** කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වසරේ වැඩසටහන් රජය විසින් සීමා කරන ලදී. එබැවින් සැලසුම් කරන ලද වැඩසටහන් අවලංගු කරන ලදී.

4.1.10 ජාතික කෘෂිකාර්මික තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	75% - 89%	50% - 74%
1. මෙහෙයවන ලද ගුවන්විදුලි වැඩසටහන් සංඛ්‍යාව	√		
2. මෙහෙයවන ලද වීඩියෝ වැඩසටහන් සංඛ්‍යාව	√		
3. මුද්‍රණය කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව	√		
4. සිදු කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ක්‍රියාකාරකම් සංඛ්‍යාව			√
5. කෘෂි තාක්ෂණ උද්‍යාන සඳහා පැමිණි නරඹන්නන් සංඛ්‍යාව			√
6. පාසල් ශිෂ්‍යයන් පැවැත්වූ පුහුණු සංඛ්‍යාව			√
7. කෘෂි තාක්ෂණ උද්‍යාන වල නිෂ්පාදිත බෝග ප්‍රමාණය		√	

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	වැඩසටහන	තිරසාර සංවර්ධන ඉලක්ක අංකය	තිරසාර සංවර්ධන දර්ශක අංකය	තිරසාර සංවර්ධන ප්‍රගතිය		
				0 - 49%	50 - 74%	75 - 100 %
අරමුණ 2: සාගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාවය සහ වැඩිදියුණු පෝෂණය සාක්ෂාත් කරගැනීම, සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය.	1. හරිත කෘෂිකර්ම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම	2.4	2.4.1			√
	2. බෝගවල ඵලදායීතාවය වැඩි දියුණු කිරීමේ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	2.3	2.3.1 2.3.2			√
	3. කෘෂි තාක්ෂණික ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	2.3	2.3.1 2.3.2	√		
	4. ගුණාත්මයෙන් ඉහළ බීජ නිෂ්පාදන හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	2.3	2.3.1 2.3.2			√
	5. ජාන සම්පත් සංරක්ෂණ හා උපයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම	2.5	2.5.1			√

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ පරිච්ඡේද අංක 02හි දක්වා ඇත.

අභියෝග:

- 2021 වසරේදීත් පැවති කොවිඩ් 19 වසංගත තත්වය
- දේශගුණික වෙනස්වීම්
- අනපේක්ෂිත රෝග හා පළිබෝධ පැතිරීම
- ඇතැම් සුවිශේෂී කාර්යයන් සඳහා අවශ්‍ය පුහුණු මානව සම්පත් හිඟය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	1,050	414	636
තෘතීයික	208	72	136
ද්විතියික	3,638	2,945	693
ප්‍රාථමික	6,150	4,778	1,372

06.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා පුරා ව්‍යාප්ත වූ ආයතන 256කින් සමන්විත වන අතර එහි අනුමත කාර්ය මණ්ඩලය හා සිටින කාර්ය මණ්ඩලය සංසන්දනය කිරීමේදී තනතුරු 2837ක් සඳහා නිලධාරි හිඟයක් පවතී. පසුගිය වර්ෂයේ රට පුරා පැතිර ගිය කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් බඳවා ගැනීම් කිසිවක් සිදු නොවීය.

අංක 1880/26 හා 2014.09.19 දිනැති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථාව සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වූ SCC(FR) 283/2014 දරණ පෙත්සම හේතුවෙන් වසර 09කට ආසන්න කාලයක් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වූ අතර 2021.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 704ක් බවට පත්ව ඇත. මෙම ශ්‍රේෂ්ඨාධිකරණ පෙත්සමේ පෙත්සම්කාර හා වගඋත්තරකාර පාර්ශවයන් විසින් 2021.03.08 දින සමථයකට එළඹී ඇති බැවින් මේ වන විට නැවත බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව අංක 2, 258 දරණ 2021.12.10 දිනැති රජයේ ගැසට් නිවේදනයෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහාත් අංක 2,257 දරණ 2021.12.03 දිනැති ගැසට් නිවේදනයෙන් සීමිත තරඟ විභාගය සඳහාත් අයදුම්පත් කැඳවා ඇත.

එමෙන්ම සෘජුවම ක්ෂේත්‍රයේ කටයුතු කරන ස්ථීර කම්කරු සේවක හිඟය 854ක් වීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉදිරි ඉලක්ක සපුරා ගැනීමේදී දැඩිව බලපායි. කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2020 අනුව සියළුම ආයතනයන්හී ප්‍රාථමික සේවා ගණයේ (PL – 1, PL – 2 සහ PL – 3) තනතුරු සඳහා වන බඳවා ගැනීම් බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරෙන අතර දෙපාර්තමේන්තුවේ ආයතන සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව වෙන වෙනම බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

ඇමුණුම II

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.6	වෙනත්	අනුකූල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය(GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ .135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිද්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව , භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වා යාම .	අනුකූල වේ		
9.4	සැම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
9.6	කල්බදු කල සීමාවන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගැනීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම .	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්දයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලින කර ගැනීම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**අදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කල අදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ අදායම්, තැන්පතු ගිණුමට බර නොකොට සවම අදායමට බර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූල නොවේ	• ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ පුරප්පාඩු 704ක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් මේ වන විට කැඳවා ඇත. • කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2020 අනුව සියළුම ආයතනයන් හි ප්‍රාථමික සේවා ගණයේ (PL	දෙපාර්තමේන්තු මට්ටමින් අවශ්‍ය කාර්යයන් ඉටු කර ඇත.

			-1, PL – 2 සහ PL -3) තනතුරු සඳහා වන බඳවා ගැනීම් බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරෙන අතර දෙපාර්තමේන්තුවේ ආයතන සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යා වෙන වෙනම බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	2017. 09.20 දිනැති DMS චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව	අනුකූල වේ		

	තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.			
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳව මහජනතාවගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හා වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	ඒම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සැම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය	අනුකූල වේ	එනමුත් කොවිඩ් - 19 වසංගත	මාර්ගගත ක්‍රමයට පුහුණු වැඩසටහන්

	12කට නොඅඩු පුහුණු අවශ්‍යතාවයක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම.		තත්වය මත හා ධාරිතා සංවර්ධනය සඳහා වූ සීමිත ප්‍රතිපත්ති හේතුවෙන් පුහුණු වැඩසටහන් බොහොමයක් අවලංගු කිරීමට සිදු විය.	පැවැත්වීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

ඇමුණුම්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } කේඩීඒ/බී/ඩීඒ/2/21/ඩී/74 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 24 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම්**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් වල ආරම්භක ශේෂය රු. 26,383,858,018 ක් වුවද ඊට ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ විෂයෙහි හා ඊට අදාළ සංචිත ශේෂය රු. 24,525,447,790 ක් වුයෙන් රු.1,858,410,228 ක ගැලපීම්වලට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් දේපළ පිරියත හා උපකරණ ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 24,525,447,790 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශය SA82 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂයේ ජනවාරි 1 දිනට ශේෂය රු. 24,528,396,296 ක් වුයෙන් රු. 2,948,506 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුවසහභාණ්ඩාගාර ප්‍රකාශය SA82 ආකෘතිය අනුව වෙනත් යන්ත්‍ර හා උපකරණ විෂයයන්ට අදාළ එක් එක් ශේෂ වල වෙනස්කම් පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන උපකරණ ශේෂය රු.1,439,705,548 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුවඑම ශේෂය රු.1,192,187,538 ක් වූයෙන් ප්‍රවාහන උපකරණ ශේෂය රු.247,518,010 ක් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුවට අයත් වාහන 184 ක වටිනාකම ගණනය කර හෝ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර හෝ නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි හා නොනිමි වැඩ ශේෂය රු.6,491,554,294 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුවඑම ශේෂය රු. 1,908,156,606 ක් වූයෙන් ගොඩනැගිලි හා නොනිමි වැඩ ශේෂය රු.4,583,397,688 ක් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැඟිලි 148 ක් තක්සේරු කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණද තක්සේරු කර නොතිබුණ අතර ගොඩනැඟිලි 1388 කට අදාළව වටිනාකම් හඳුනාගැනීම සඳහා තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් කළමනාකරණ අංශය විසින් ඉඩම් ශේෂයට අදාළ වටිනාකම ඉදිරිපත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුව එම ශේෂය රු.17,813,491,318 ක් විය. තවද ඉඩම් ඒකක 517 කට අදාළව වටිනාකම් ගණනය කර නොතිබුණු අතර ඉඩම් ඒකක 103 කට අදාළව භූමි ප්‍රමාණයන් ද හඳුනාගෙන වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලීබඩු ඇතුළුව වෙනත් යන්ත්‍ර හා උපකරණ ශේෂය රු.2,410,236,758 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුව එම ශේෂය රු.995,223,344 ක් වූයෙන් ලීබඩු ඇතුළුව වෙනත් යන්ත්‍ර හා උපකරණ ශේෂය රු.1,415,013,414 ක් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වත්කම් වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.2.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්වලට අදාළව මුදල් ගලා යාම රු. 6,055,095,662 ක් වුවද එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් යටතේ රු. 4,641,593,129 ක් ලෙසට දැක්වීමෙන් මුදල් ගලායාම් රු. 1,413,502,533 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදි ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රමාණය රු. 111,606,276 ක් වුවද එය රු. 1,525,108,809 ක් ලෙසට රු. 1,413,502,533 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශය ACA5 ආකෘතිය අනුව ගොවිපළ නඩත්තු භාණ්ඩ අලෙවි අත්තිකාරම් ගිණුමේ 2021 වර්ෂයේ හර කිරීම් හා බැර කිරීම් පිළිවෙලින් රු. 801,737,314 ක් සහ රු. 935,890,785 ක් ලෙස දැක්විය යුතු වුවද එම ආකෘතියේ එම අගයන් රු. 198,325,389 ක් සහ 184,302,639 ක් ලෙස දක්වා තිබුණි.

1.6.4 වාණිජ අත්තිකාරම් ගිණුම්

දෙපාර්තමේන්තුව විසින් අංක 28502 දරන වාණිජ අත්තිකාරම් ගිණුමේ කටයුතු ඉටු කර තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ එම ගිණුම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

1.6.4.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිකවැරටිය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය 2021 වර්ෂය තුළ රු.400,000 ක ට්‍රැක්ටර් රථයක් එළුවන්කුලම ගොවිපළට යවා තිබුණද එය ප්‍රවර්තන වර්ෂයේ එළුවන්කුලම ගොවිපලෙහි වත්කම් තක්සේරු වාර්තාවේ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.17,593 කින් අඩුවෙන් දැක්විණි.

(ආ) අත්තිකාරම් කාර්යයට දායකත්වය දක්වන නියෝජ්‍ය කෘෂිකර්ම කාර්යාල හා සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 05 කට අදාළ වටිනාකම රු.60,132,527 ක ගබඩා සෘජුව ගොවිපල කටයුතු සඳහා යොදා ගෙන තිබුණ ද එම ගොඩනැගිලිවල වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ක්ෂය කර නොතිබුණි.

(ඇ) කරදියනාරු බීජ නිෂ්පාදන ගොවිපලේ රු.182,250 ක ඉන්වෙන්ට්‍රි භාණ්ඩ විෂයක් අපහරණය කර තිබුණු අතර, එය මිල දී ගෙන තිබුණේ 2011 වර්ෂයේ දී විය. ඒ අනුව වසර 9 ½ ක් සඳහා රු. 115,173 ක් ක්ෂය ඉවත් කළ යුතු වුවද ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය ඉවත් කිරීම් ලෙස එම වත්කමට අදාළව වසර 04 ½ ක් සඳහා වූ රු 68,811.93 ක ක්ෂය අඩු කර තිබුණි. ඒ අනුව රු.46,361 ක සමුච්චිත ක්ෂය, ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

(ඈ) පැල්වෙහෙර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග තක්සේරු වාර්තාව අනුව රු. 353,304 ක පාරිභෝගික වී තොගය අවසන් නිමි තොගයට ඇතුලත් නොකිරීම නිසා වෙළෙඳ ගිණුමේ ලාභය එම අගයෙන් අඩුවෙන් දැක්විණි.

(ඉ) හොරණ පලතුරු බෝග පර්යේෂණ ආයතනයේ සමාලෝචිත වර්ෂයේ තොග තක්සේරු වාර්තාව අනුව රෝපණ ද්‍රව්‍ය වටිනාකම රු.148,318 ක් ලෙසට ගිණුම්ගත කළ යුතු වුවද රු.1,107,318 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, රෝපණ ද්‍රව්‍ය තොගයේ වටිනාකම හා දළ ලාභය රු.959,000 කින් වැඩියෙන් දැක්වේ.

(ඊ) දේශීය අර්තාපල් බීජ ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ මිලට ගෙන තිබුණු එකතුව රු. 1,539,738 ක වත්කම් විෂයයන් 09 ක් අදාළ ගොවිපල/ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලවල ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණු අතර ඒ හේතුවෙන් ඊට අදාළ වත්කම් ක්ෂය ද ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ගොවිපල් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුල මිලට ගෙන තිබුණු එකතුව රු. 8,502,400 ක වත්කම් විෂයයන් 06 ක් අදාල ගොවිපලවල ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණු අතර ඒ හේතුවෙන් වර්ෂයට අදාල යන්ත්‍ර ක්ෂය රු. 212,560 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

